# හින්දී භාෂාව

## ගුරු මාර්ගෝපදේශය

## 13 වැනි ශ්‍රේණිය

(2018 වර්ෂයේ සිට ක්‍රියාත්මක වේ.)

සම්භාව්‍ය භාෂා හා විදේශ භාෂා අංශය
ජාතික අධ්‍යාපන ආයතනය
ශ්‍රී ලංකාව

වෙබ් අඩවිය :www.nie.lk

විද්‍යුත් තැපැල :info@nie.lk

හින්දී භාෂාව

ගුරු මාර්ගෝපදේශය

13 ශ්‍රේණිය

ප්‍රථම මුද්‍රණය - 2017

© ජාතික අධ්‍යාපන ආයතනය

ISBN

සම්භාව්‍ය භාෂා හා විදේශ භාෂා අංශය

ජාතික අධ්‍යාපන ආයතනය

ශ්‍රී ලංකාව

*වෙබ් අඩවිය www.nie.lk*

*විද්‍යුත් තැපැල :info@nie.lk*

මුද්‍රණය

ජාතික අධ්‍යාපන ආයතනය

## අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවිඩය

ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිර්දේශිත ජාතික අධ්‍යාපන අරමුණු සාක්ෂාත් කර ගැනීම සහ පොදු නිපුණතා සංවර්ධනය කිරීමේ මූලික අරමුණ සහිත ව එවකට පැවති අන්තර්ගතය පදනම් වූ විෂයමාලාව නවීකරණයට භාජනය කොට වර්ෂ අටකින් යුතු චක්‍රයකින් සමන්විත නව නිපුණතා පාදක විෂයමාලාවෙහි පළමු අදියර වර්ෂ 2007 දී ජාතික අධ්‍යාපන ආයතනය විසින් ශ්‍රී ලංකාවේ ප්‍රාථමික හා ද්විතීයික අධ්‍යාපන ක්ෂේත්‍රයට හඳුන්වා දෙන ලදි.

පර්යේෂණවලින් අනාවරණය වූ කරුණු ද අධ්‍යාපනය පිළිබඳ ව විවිධ පාර්ශ්වයන් ඉදිරිපත් කළ යෝජනා ද පදනම් කොට ගෙන සිදු කරන ලද විෂයමාලා තාර්කිකකරණය කිරීමේ ක්‍රියාවලියක ප්‍රතිඵලයක් ලෙස විෂයමාලා චක්‍රයේ දෙවැනි අදියර අධ්‍යාපන ක්ෂේත්‍රයට හඳුන්වා දීම 2015 වසරේ සිට ආරම්භ කර ඇත.

මෙම තාර්කිකකරණ ක්‍රියාවලියේ දී සියලු ම විෂයයන්ගේ නිපුණතා පදනම් මට්ටමේ සිට උසස් මට්ටම දක්වා ක්‍රමානුකූල ව ගොඩනැඟීම සඳහා පහළ සිට ඉහළට ගමන් කරන සිරස් සංකලනය භාවිත කර ඇති අතර විවිධ විෂයයන්හි දී එක ම විෂය කරුණු නැවත නැවත ඉදිරිපත් වීම හැකි තාක් අවම කිරීම, විෂය අන්තර්ගතය සීමා කිරීම සහ ක්‍රියාත්මක කළ හැකි ශිෂ්‍ය මිතුරු විෂයමාලාවක් සැකසීම සඳහා තිරස් සංකලනය ද භාවිත කර ඇත.

ගුරු භවතුන්ට පාඩම් සැලසුම් කිරීම, ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියෙහි සාර්ථක ව නිරත වීම, පන්ති කාමර මිනුම් හා ඇගයීම් ප්‍රයෝජනවත් පරිදි යොදා ගැනීම යන කාර්ය සඳහා අවශ්‍ය වන මාර්ගෝපදේශ ලබාදීමේ අරමුණින් නව ගුරු මාර්ගෝපදේශ හඳුන්වා දී ඇත. පන්ති කාමරය තුළ දී වඩාත් ඵලදායී ගුරුවරයකු ලෙස කටයුතු කිරීමට මෙම මාර්ගෝපදේශ උපකාරී වනු ඇත. සිසුන්ගේ නිපුණතා වර්ධනය කිරීම සඳහා ගුණාත්මක යෙදවුම් හා ක්‍රියාකාරකම් තෝරා ගැනීමට ගුරුවරුන්ට අවශ්‍ය නිදහස මෙමඟින් ලබා දී තිබේ. එමෙන් ම නිර්දේශිත පාඨ ග්‍රන්ථවල ඇතුළත් වන විෂය කරුණු පිළිබඳ ව වැඩි බර තැබීමක් මෙම ගුරු මාර්ගෝපදේශවල අන්තර්ගත නොවේ. එම නිසා මෙම ගුරු මාර්ගෝපදේශය වඩාත් ඵලදායී වීමට නම් අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව විසින් සකසනු ලැබ ඇති අදාළ පාඨ ග්‍රන්ථ සමග සමගාමී ව භාවිත කිරීම අත්‍යවශ්‍ය වේ.

තාර්කිකකරණය කරන ලද විෂය නිර්දේශ, නව ගුරු මාර්ගෝපදේශ හා නව පාඨ ග්‍රන්ථවල මූලික අරමුණු වන්නේ ගුරු කේන්ද්‍රීය අධ්‍යාපන රටාවෙන් මිදී ශිෂ්‍ය කේන්ද්‍රීය අධ්‍යාපන රටාවකට හා වඩාත් ක්‍රියාකාරකම් මත පදනම් වූ අධ්‍යාපන රටාවකට එළඹීම මඟින් වැඩ ලෝකයට අවශ්‍ය වන්නා වූ නිපුණතාවලින් හා කුසලතාවලින් යුක්ත මානව සම්පතක් බවට ශිෂ්‍ය ප්‍රජාව සංවර්ධනය කිරීම යි.

නව විෂය නිර්දේශ සහ ගුරු මාර්ගෝපදේශ සම්පාදනය කිරීමේ දී ජාතික අධ්‍යාපන ආයතනයේ ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලයේ ද ආයතන සභාවේ ද රචනයේ දී දායකත්වය ලබා දුන් සියලු ම සම්පත් දායකයන්ගේ හා වෙනත් පාර්ශවයන්ගේ ද ඉමහත් කැපවීම ඇගයීමට ද මෙය අවස්ථාවක් කරගනු කැමැත්තෙමි.

**ආචාර්ය ජයන්ති ගුණසේකර,**
**අධ්‍යක්ෂ ජනරාල්,**
**ජාතික අධ්‍යාපන ආයතනය,**
**මහරගම.**

## නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවිඩය

ඉගෙනුම, පුළුල් ක්ෂේත්‍රයක විහිද යන්නකි. එය ජීවිත අතිමහත් බවට ද, ඉතා ම සරල බවට ද පත්කරයි. මනුෂ්‍යයා ඉගෙනුම් කුසලතාවෙන් උත්කෘෂ්ට ය. මානව සමාජ සංවර්ධනය කේන්ද්‍ර කොට ගත් රටක්, සමාජයක් බුද්ධිය විසින් හඳුනාගත් අසම්මතයන් බැහැර කිරීමට ද සුභාවිතයන් තුළින් නව ලොවක් නිර්මාණය කර ගැනීමට ද මෙවලම කරගනු ලබන්නේ ඉගෙනුමයි.

ඉගෙනුම සඳහා වටිනා යමක් ද, ඉගෙනුම් ක්‍රමවේදයන් හා පහසුකම් ද අධ්‍යාපනය වටා නිර්මාණය විය යුතු ය. විෂය මාලාව, විෂය නිර්දේශ, මාර්ගෝපදේශ, සුසාධ්‍යකරුවන් ඉගෙනුම් ක්ෂේත්‍රයට එක්වනුයේ මේ ආකාරයෙනි.

නූතන ශ්‍රී ලංකාව ගෝලීය ප්‍රවණතාවන් මෙන් ම පුරාතන උරුමයන් ද සම්මිශ්‍රණය කර ගනිමින් ස්වීය අධ්‍යාපන රටාවක් හිමි කරගෙන ඇත. කාලීන අවශ්‍යතා මත ප්‍රතිසංස්කරණයන් තුළින් වසර අටකට වරක් යාවත්කාලීන වන විෂය මාලාවේ ඉගෙනුම් සම්පතක් ලෙස මෙම ගුරු මාර්ගෝපදේශ නිර්මාණය වේ.

විෂයයෙහි අරමුණුවල සංගතතාව ජාතික මට්ටමින් පවත්වාගත යුතු ය. එහෙත් ගුරු මාර්ගෝපදේශයන්හි ඉගෙනුම් ක්‍රමවේදයන්, අකුරක්වත් වෙනස් නොකොට පිළිපැදිය යුත්තක් නම් නොවේ. විෂය නිර්දේශයෙහි නිපුණතා, නිපුණතා මට්ටම්, සාධනය වීම සඳහා විෂය අන්තර්ගතය තුළින් ඉගෙනුම් පල සම්ප්‍රාප්තිය පිණිස ඉගෙනුම් ක්‍රමවේද නිර්මාණශීලී ව වෙනස්කර ගැනීමට සුසාධ්‍යකරුවන්ට පැහැදිලිව ම ඉඩක් ඇති බව සඳහන් කරමි. ශිෂ්‍ය සාධන ප්‍රතිශතය ඉහළ මට්ටමකට ගැනීම සඳහා උදව් වන, පහසුකම් සලසන ගුරු භූමිකාවට කිසියම් ප්‍රවේශයක් සඳහා නිර්මාණය වන ගුරු මාර්ගෝපදේශ ශික්ෂකයාහට ද දෙගුරුනට ද භාවිත කළ හැක. අදාළ පෙළ පොතට සහකරුවකු වන ගුරු මාර්ගෝපදේශය තවත් පෙළ පොතක් නොවන බව දැන ගුරුභවතුන් ගුරු මාර්ගෝපදේශ හා අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ සම්පාදිත අදාළ පෙළ පොත යන සම්පත් ද්‍රව්‍ය දෙක ම භාවිත කළ යුතු ය.

ඒ ඒ විෂයයන්හි සාධනය පිළිබඳ ඇගැයීම් සිදුකරන ජාතික මට්ටමේ පරීක්ෂකවරයෙකු වුව ද අපේක්ෂා කරන සාධනයන්, විෂය ඉගැන්වීමට මග පෙන්වන සුසාධ්‍යකරුවන් විසින් පාඩම අවසානයෙහි පන්ති කාමරයේ දී දරුවන් සමග ප්‍රත්‍යක්ෂකරණයට පත්විය යුතු ය. එම ඒකාත්මික වීම සඳහා වූ ප්‍රබෝධාත්මක සංස්කෘතියක් ගොඩනගා ගැනීමට ගුරු මාර්ගෝපදේශය පහුරක්, යාත්‍රාවක් කරගනු ඇතැයි ආයාචනා පූර්වක ව අපේක්ෂා කරමි.

**ආචාර්ය පූජ්‍ය මාඹුල්ගොඩ සුමනරතන හිමි**
**පීඨාධිපති, නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්**
**භාෂා, මානව ශාස්ත්‍ර, විකල්ප අධ්‍යාපන හා සමාජවිද්‍යා පීඨය**
**ජාතික අධ්‍යාපන ආයතනය.**

## විෂයමාලා කමිටුව

| | | |
|---|---|---|
| උපදේශකත්වය හා අනුමතිය | - | ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලය,<br>ජාතික අධ්‍යාපන ආයතනය. |
| විෂය සම්බන්ධීකරණය | - | ඊ.එම්. තනුජා ගීතානි ජයතිලක මිය,<br>සහකාර කථිකාචාර්ය,<br>ජාතික අධ්‍යාපන ආයතනය. |
| විෂය සංස්කරණය | - | ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ලක්ෂ්මන් සෙනෙවිරත්න,<br>නියෝජ්‍ය උප කුලපති, මානව ශාස්ත්‍ර පීඨය,<br>කැලණිය විශ්වවිද්‍යාලය. |
| | | ජ්‍යෙෂ්ඨ මහාචාර්ය උපුල් රංජිත් හේවාවිතානගමගේ,<br>හින්දී අධ්‍යයනාංශය,<br>කැලණිය විශ්වවිද්‍යාලය. |

ලේඛක මණ්ඩලය

01. අනුෂා නිල්මිණි සල්වතුර මිය,
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය,
හින්දී අධ්‍යයනාංශය,
කැලණිය විශ්වවිද්‍යාලය.

02. නීතා සුභාෂිණි සෙනෙවිරත්න මිය,
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය,
හින්දී අධ්‍යයනාංශය,
කැලණිය විශ්වවිද්‍යාලය.

03. නිලන්ති රාජපක්ෂ මිය,
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය,
භාෂා හා ප්‍රාසාංගික කලා අධ්‍යයනාංශය,
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය.

04. ආර්.ජේ.කේ. අනෝමා මිය,
ගම්පහ බණ්ඩාරනායක විද්‍යාලය.

05. ඩබ්.එම්. මාධවී ඩී ජයරත්න මිය,
කු/ මලියදේව බාලිකා විද්‍යාලය.

භාෂා සංස්කරණය

06. ශ්‍රීනාත් ගනේවත්ත මයා,
සිංහල භාෂා සංස්කාරක.

07. ඊ.ආර්. නිමල් ප්‍රේමකුමාර,
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය,
සිංහල භාෂා දෙපාර්තමේන්තුව,
ජාතික අධ්‍යාපන ආයතනය.

# ගුරු මාර්ගෝපදේශය පරිශීලනය සඳහා උපදෙස්

2007 නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණය යටතේ පාසල් පද්ධතියට හඳුන්වා දී ඇති නිපුණතා පාදක විෂය මාලාව පාසල් අධ්‍යාපනයේ පූර්ණ පරිවර්තනයක් ඇති වන ආකාරයෙන් සැලසුම් කර තිබේ. නිපුණතාවක් යනු දැනුම (Knowledge), කුසලතා (Skills), ආකල්ප (Attitudes), පෞද්ගලික හා සමාජීය හැකියා (Personal & Social Abilities) යන මේ සංරචකවලින් සමන්විත වූවකි. ඒ අනුව වැඩ කිරීමේ දී හෝ ඉගෙන ගැනීමේ දී දැනුම, කුසලතා, ආකල්ප, පෞද්ගලික හා සමාජීය හැකියා යොදා ගැනීමට ඇති කුසලතාව නිපුණතාවක් ලෙස හැඳින්විය හැකි ය.

හින්දී විෂය නිර්දේශය ද නිපුණතා පාදක වූවකි. පාසල් සිසුන්ගේ චින්තන කුසලතා, පුද්ගල කුසලතා හා සමාජ කුසලතා ද ගොඩ නැගීමේ අරමුණෙන් පාසල් තුළ හින්දී භාෂාව ඉගැන්වීම කළ යුතු වේ. ඒ වෙනුවෙන් සැකසුණු නිපුණතා පාදක විෂය නිර්දේශයට අනුව මෙම ගුරු මාර්ගෝපදේශය නිර්මාණය කොට ඇත. එහි දී විෂය භාර ගුරුභවතා විසින් පහත සඳහන් කරුණු කෙරෙහි අවධානය යොමු කොට ඉගැන්වීම් ක්‍රියාවලියෙහි යෙදිය යුතු වේ.

13 ශ්‍රේණිය සඳහා නිපුණතා 10 ක් හා ඒ ඒ නිපුණතාවට අදාළ නිපුණතා මට්ටම් විෂය නිර්දේශයේ ඇතුළත් වේ. එම නිපුණතා මගින් හින්දී භාෂාවේ නිවැරදි උච්චාරණය සහ නිවැරදි ලේඛනය, හින්දී භාෂාව ශ්‍රවණයෙන් අර්ථය අවබෝධ කරගෙන ප්‍රතිචාර දැක්වීමේ හැකියාව ද හින්දී භාෂාව සරල ව කතා කිරීමේ හැකියාව ද ශිෂ්‍යයා තුළ ඇති කරයි. හින්දී භාෂාව හා සම්බන්ධ ව්‍යාකරණ පිළිබඳ මූලික අවබෝධය ශිෂ්‍යයා තුළ ඇති කරන අතර හින්දී ගද්‍ය පාඨ කියවා අර්ථය අවබෝධ කර ගැනීමේ හැකියාව හා ශිෂ්‍යයා තුළ පරිවර්තන හැකියාව ද ඇති කරයි. ගුරුවරයාට ඉගැන්වීමේ පහසුව සඳහා ද, ශිෂ්‍යයාට ඉගෙන ගැනීමේ පහසුව සඳහා ද, පරිශීලන ග්‍රන්ථ ආධාර කර ගත හැකි ය. පන්ති කාමර අධ්‍යාපනය මෙන් ම ක්ෂේත්‍ර අධ්‍යාපනය ද මෙහි දී යොදා ගත යුතු අතර තාක්ෂණික ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමවේදය ද භාවිතයට ගැනීම අවශ්‍ය වේ. ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියේ දී හා පාඩම් සැලසුම්කරණයේ දී ඉගෙනුම් පල ගුරුවරයාට බෙහෙවින් ප්‍රයෝජනවත් වේ. ඉගෙනුම් පල යනු යම් පාඩමක් ඉගෙන ගැනීමෙන් අනතුරුව සිසුවා සාධනය කර ගනී යැයි අපේක්ෂිත ප්‍රතිඵලය යි. ගුණාත්මක යෙදවුම්, පාඩමේ සංවර්ධනය සඳහා ද ඉගෙනුම් ක්‍රියාවලියේ ඒකාකාරී, නීරස බව ඉවත් කරමින් එහි ප්‍රතිඵලදායක වර්ධනයක් ඇති කිරීම සඳහා ද උපකාරී කර ගත හැකිය. පන්ති කාමර ඉගෙනුම් ක්‍රියාවලිය සාර්ථක ව සිදු වන්නේ දැයි සොයා බැලීම ගුරුවරයාගේ ප්‍රධාන වගකීමක් වන අතර, එය තක්සේරුව හා ඇගයීම ගුරුවරයාට ප්‍රයෝජනවත් වේ. එමගින් ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියේ සාර්ථකත්වය මෙන් ම ගුරු සිසු අන්‍යෝන්‍ය සබඳතාව ද තහවුරු වේ.

නිපුණතා හා නිපුණතා මට්ටම් කෙරෙහි සැලකිලිමත් වෙමින් විෂය අන්තර්ගතය කෙරෙහි දැඩි අවධානය යොමු කොට අපේක්ෂිත ඉගෙනුම් පල පාඩම අවසානයේ දී ශිෂ්‍යයාගෙන් තුළින් ප්‍රකට වන පරිදි ඉගැන්වීම් ක්‍රියාවලියේ නියුක්ත විය යුතු ය. සෑම නිපුණතා මට්ටමක් සඳහා ම අදාළ විෂය කරුණුවල සංක්ෂිප්තය ලබා දී ඇති අතර යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමයක් දක්වා ඇත. 13 ශ්‍රේණිය හින්දී විෂය නිර්දේශයට අදාළ ව නිර්දිෂ්ට ග්‍රන්ථ තුනක් හා අනෙකුත් පරිශීලන ග්‍රන්ථ භාවිත කළ යුතු බැවින් මෙම ගුරු මාර්ගෝපදේශයේදී වැඩි අවධානයක් යොමු කොට ඇත්තේ එක් එක් නිපුණතා මට්ටම්වලට අදාළ ව පාඩම් සැලැසුම් සකස් කර ගත යුතු ආකාරය පෙන්වා දීම සඳහා ය. අදාළ විෂය කරුණු සියල්ල නිර්දිෂ්ට හා පරිශීලන ග්‍රන්ථවල සඳහන් වේ.

පන්ති කාමරයට උචිත පරිදි වඩාත් නිර්මාණශීලී ක්‍රමයක් භාවිත කිරීමට ගුරුවරයාට මෙහි දී නිදහස හිමි වේ. මෙහි කාලච්ඡේද ගණනය කර ඇත්තේ විෂය අන්තර්ගතය පිළිබඳ සැලකිලිමත් වෙමිනි. වර්ෂයට නියමිත කාලච්ඡේද සංඛ්‍යාව නො ඉක්මවන පරිදි නිපුණතාවලට වෙන් කර ඇති කාලච්ඡේද ප්‍රමාණ සංශෝධනය කරගැනීමට ගුරුවරයාට නිදහස ඇත. තක්සේරුව හා ඇගයීම් වැඩපිළිවෙළ සඳහා,ලබා දී ඇති නිර්ණායක පදනම් කොට ගනිමින් එම නිපුණතා ශිෂ්‍යයාගෙන් ප්‍රකට කොට ගැනීම ඉගැන්වීම් කාර්යයේ මුල සිට අග තෙක් ම සිදු කළ හැකි ය. සිසුන්ගේ හැකියා නො හැකියා අනුව ඉදිරිපෝෂණය හා ප්‍රතිපෝෂණය ලබා දිය යුතු ය.

නිපුණතා පාදක අධ්‍යාපනයේ දී සාම්ප්‍රදායික ගුරු භූමිකාවේ පැහැදිලි වෙනසක් අපේක්ෂා කෙරේ. සාම්ප්‍රදායික ව භාවිත කළ දේශන ක්‍රමය පදනම් කරගත් සම්ප්‍රේෂණ ගුරු භූමිකාව වෙනුවට ගවේෂණයේ යෙදීමට සිසුවාට ඉඩ සලසමින් සිසු විභවතා මතු කර ගැනීමට සමත් පරිණාමන ගුරු භූමිකාවක අවශ්‍යතාව පැන නැගී ඇත. එබැවින් සාම්ප්‍රදායික පන්ති කාමර, ගුරු කේන්ද්‍රීය අධ්‍යාපනයෙන් මිදී ශිෂ්‍ය කේන්ද්‍රීය අධ්‍යාපනය මඟින් සිසුවා වෙත සමීප වීමටත් නවීන තාක්ෂණය ද ප්‍රයෝජනයට ගනිමින් සාර්ථක ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියක නිරත වීමට ගුරුවරයා මඟ පාදා ගත යුතු ය.

විෂය නිර්දේශයේ ඇතුළත් නිපුණතාවලට අදාළ විෂය අන්තර්ගතය ඇසුරින් නිපුණතා මට්ටම් සාක්ෂාත් වන පරිදි ඉගැන්වීම් ක්‍රියාවලියේ යෙදී ඉගෙනුම් පල අත්පත් කර ගත යුතු අතර, ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය ගුරු ස්වාධීනත්වය අනුව නිර්මාණාත්මක ව සිදු කර ගත යුතු ය.

ඊ.එම්. තනුජා ගීතානි ජයතිලක මිය
**ව්‍යාපෘති නායක**

# පටුන

පිටු අංක


| | | |
|---|---|---|
| 01 | අධ්‍යක්‍ෂ ජනරාල්තුමියගේ පණිවිඩය | iii |
| 02 | නියෝජ්‍ය අධ්‍යක්‍ෂ ජනරාල් හිමිගේ පණිවිඩය | iv |
| 03 | විෂය මාලා කමිටුව | v |
| 04 | ගුරු මාර්ගෝපදේශය පරිශීලනය සඳහා උපදෙස් | vi -vii |
| 05 | පටුන | viii |
| 06 | විෂය නිර්දේශයේ අන්තර්ගතය | ix-xxvi |
| 07 | ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස් | 27-49 |
| 08 | නිපුණතාව 1 | 28-29 |
| 09 | නිපුණතාව 2 | 30-31 |
| 10 | නිපුණතාව 3 | 32-33 |
| 11 | නිපුණතාව 4 | 34-35 |
| 12 | නිපුණතාව 5 | 36-37 |
| 13 | නිපුණතාව 6 | 38-40 |
| 14 | නිපුණතාව 7 | 41-42 |
| 15 | නිපුණතාව 8 | 43-44 |
| 15 | නිපුණතාව 9 | 45-48 |
| 15 | නිපුණතාව 10 | 49 |
| 16 | ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය ප්‍රවර්ධනය කිරීමේ නිදර්ශක ආධාරකය | 50-51 |

# හින්දි

# විෂය නිර්දේශය

# 13 ශ්‍රේණිය

# හැඳින්වීම

හින්දී භාෂාව අපගේ අසල්වැසි රට වන ඉන්දියාවේ රාජ්‍ය භාෂාව වන අතර, උතුරු ඉන්දියාවේ විශාල භූමි ප්‍රදේශයක වෙසෙන ඉන්දියානු ජනගහනයෙන් අඩකට ආසන්න ජනතාවගේ මාතෘ භාෂාව ද වේ. මීට අමතර ව සූරිනාම්, ෆීජී, ගයනා මොරිෂස් වැනි රටවල බහුල වශයෙන් ද, ලෝකයේ වෙනත් රටවල් රාශියක ද හින්දී භාෂාව භාවිත වනු දක්නට ලැබෙයි. එමෙන් ම, ලෝකයේ ප්‍රමුඛ පෙළේ විශ්වවිද්‍යාලය රාශියක සහ වෙනත් ආයතන රාශියක ද විදේශ භාෂාවක් ලෙස හින්දී භාෂාව උගන්වනු ලබයි.

භාෂාත්මක වශයෙන් සිංහල භාෂාවට ඇති ඥාතිත්වයත්, ආගමික, සංස්කෘතික, සාහිත්‍යයික, දේශපාලන, ආර්ථික හා සමාජීය සම්බන්ධතාත් හේතු කොට ගෙන විදේශීය භාෂාවක් ලෙස හින්දී භාෂාව ඉගෙනීම ශ්‍රී ලාංකිකයන්ට අතිශයින් වැදගත් වෙයි. විශේෂයෙන් ම සංගීතය, නර්තනය, චිත්‍ර ආදි පෙරදිග කලාවන් මෙන් ම ආයුර්වේදය, පුරාවිද්‍යාව, ඉතිහාසය, අන්තර්ජාතික අධ්‍යයන වැනි විෂය ක්ෂේත්‍රයන් හැදෑරීමේ දී ද හින්දී භාෂාව අත්‍යවශ්‍ය ය.

මීට අමතර ව සංචාරක, ව්‍යාපාරික, ජනමාධ්‍ය, මැද පෙරදිග සේවා, භාෂා පරිවර්තනය වැනි ක්ෂේත්‍රවල හා කටයුතු කිරීමේ දී හින්දී භාෂා ඥානය ප්‍රයෝජනවත් වේ.

# ජාතික අරමුණු

පුද්ගලයාට හා සමාජයට අදාළ වන ප්‍රධාන ජාතික අරමුණු කරා ළඟා වීම සඳහා පුද්ගලයන්ට සහ කණ්ඩායම්වලට ජාතික අධ්‍යාපන පද්ධතියට සහාය විය යුතු ය.

වසර ගණනාවක් මුළුල්ලේ ශ්‍රී ලංකාවේ ප්‍රධාන අධ්‍යාපන වාර්තා සහ ලේඛන මගින් පුද්ගල හා ජාතික අවශ්‍යතාවන් සපුරාලීම සඳහා අරමුණු නියම කරනු ලැබී ය. සමකාලීන අධ්‍යාපන ව්‍යූහයන් හා ක්‍රියාවලින් තුළ දැකිය හැකි දුර්වලතා නිසා ධරණීය මානව සංවර්ධන සංකල්ප රාමුව ඇතුළත අධ්‍යාපනය තුළින් ළඟා කර ගත යුතු පහත දැක්වෙන අරමුණු ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් හඳුනා ගෙන ඇත. මෙම අරමුණු සපුරා ගැනීම අධ්‍යාපන පද්ධතිය සඳහා වූ තම ඉදිරි දැක්ම ලෙසට ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් ප්‍රත්‍යක්ෂ කොට ගෙන ඇත.

෴. I මානව අභිමානයට ගරු කිරීමේ සංකල්පයක් මත පිහිටා ශ්‍රී ලාංකික බහුවිධ සමාජයේ සංස්කෘතික විවිධත්වය අවබෝධ කර ගනිමින් ජාතික ඒකාබද්ධතාව, ජාතික ඍජු ගුණය, ජාතික සමගිය, එකමුතුකම සහ සාමය ප්‍රවර්ධනය කිරීම තුළින් ජාතිය ගොඩනැගීම සහ ශ්‍රී ලාංකේය අනන්‍යතාව තහවුරු කිරීම.

II වෙනස් වන ලෝකයක අභියෝගයන්ට ප්‍රතිචාර දක්වන අතර ජාතික උරුමයේ මාහැගි දායාදයන් හඳුනා ගැනීම සහ සංරක්ෂණය කිරීම.

III මානව අයිතිවාසිකම්වලට ගරු කිරීම, යුතුකම් හා වගකීම් පිළිබඳ දැනුවත් වීම, හෘදයංගම බැඳීමකින් යුතු ව එකිනෙකා කෙරෙහි සැලැකිලිමත් වීම යන ගුණාංග ප්‍රවර්ධනය කිරීමට ඉවහල් වන සමාජ සාධාරණත්ව සම්මතයන් සහ ප්‍රජාතන්ත්‍රික ජීවන රටාවක් ගැබ් වූ පරිසරයක් නිර්මාණ කිරීම සහ පවත්වා ගෙන යාමට සහාය වීම.

IV පුද්ගලයන්ගේ මානසික හා ශාරීරික සුව සම්පත් සහ මානව අගයයන්ට ගරු කිරීම මත පදනම් වූ තිරසාර ජීවන ක්‍රමයක් ප්‍රවර්ධනය කිරීම.

V සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාපණ හැකියාව, ආරම්භක ශක්තිය, විචාරශීලී චින්තනය, වගකීම හා වගවීම ඇතුළු වෙනත් ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය කිරීම.

VI පුද්ගලයාගේ සහ ජාතියේ ජීවගුණය වැඩි දියුණු කෙරෙන සහ ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය සඳහා දායක වන ඵලදායි කාර්යයන් සඳහා අධ්‍යාපනය තුළින් මානව සම්පත් සංවර්ධනය කිරීම.

VII ශීඝ්‍රයෙන් වෙනස් වන ලෝකයක් තුළ සිදු වන වෙනස්කම් අනුව හැඩ ගැසීමට හා ඒවා පාලනය කර ගැනීමට පුද්ගලයන් සුදානම් කිරීම සහ සංකීර්ණ හා අනපේක්ෂිත අවස්ථාවන්ට සාර්ථක ව මුහුණ දීමේ හැකියාව වර්ධනය කිරීම.

VIII ජාත්‍යන්තර ප්‍රජාව අතර ගෞරවනීය ස්ථානයක් හිමි කර ගැනීමට දායක වන යුක්තිය, සමානත්වය සහ අන්‍යෝන්‍ය ගරුත්වය මත පදනම් වූ ආකල්ප හා කුසලතා පෝෂණය කිරීම.

(ජාතික අධ්‍යාපන කොමිෂන් වාර්තාව 2003)

# මූලික නිපුණතා

අධ්‍යාපනය තුළින් වර්ධනය කෙරෙන පහත දැක්වෙන මූලික නිපුණතා ඉහත සඳහන් ජාතික අරමුණු ඉටුකර ගැනීමට දායක වනු ඇත

(I) සන්නිවේදන නිපුණතා

සාක්ෂරතාව, සංඛ්‍යා පිළිබඳ දැනුම, රූපක භාවිතය සහ තොරතුරු තාක්ෂණ ප්‍රවීණතාව යන අනුකාණ්ඩ 4ක් මත සන්නිවේදන නිපුණතා පදනම් වේ.

සාක්ෂරතාව : සාවධාන ව ඇහුම්කන් දීම, පැහැදිලි ව කතා කිරීම, තේරුම් ගැනීම සඳහා කියවීම, නිවැරදි ව සහ නිරවුල් ව ලිවීම, ඵලදායි අයුරින් අදහස් හුවමාරු කර ගැනීම

සංඛ්‍යා පිළිබඳ දැනුම : භාණ්ඩ, අවකාශය හා කාලය, ගණන් කිරීම, ගණනය සහ මිනුම් සඳහා ක්‍රමානුකූල ඉලක්කම් භාවිතය

රූපක භාවිතය : රේඛා සහ ආකෘති භාවිතයෙන් අදහස් පිළිබිඹු කිරීම සහ රේඛා, ආකෘති සහ වර්ණ ගළපමින් විස්තර, උපදෙස් හා අදහස් ප්‍රකාශනය හා වාර්තා කිරීම

තොරතුරු තාක්ෂණ ප්‍රවීණතාව : පරිගණක දැනුම සහ ඉගෙනීමේ දී ද සේවා පරිශ්‍රයන් තුළ දී ද පෞද්ගලික ජීවිතයේ දී ද තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය උපයෝගි කර ගැනීම

(II) පෞරුෂත්ව වර්ධනයට අදාළ නිපුණතා

- නිර්මාණශීලී බව, අපසාරී චින්තනය, ආරම්භක ශක්තීන්, තීරණ ගැනීම, ගැටලු නිරාකරණය කිරීම, විචාරශීලී හා විග්‍රහාත්මක චින්තනය, කණ්ඩායම් හැඟීමෙන් කටයුතු කිරීම, පුද්ගලාන්තර සබඳතා, නව සොයා ගැනීම් සහ ගවේෂණය වැනි වර්ගීය කුසලතා
- ඍජු ගුණය, ඉවසා දරා සිටීමේ ශක්තිය සහ මානව අභිමානයට ගරු කිරීම, වැනි අගයයන්
- චිත්තවේගී බුද්ධිය

(III) පරිසරයට අදාළ නිපුණතා
මෙම නිපුණතා සාමාජික, ජෛව සහ භෞතික පරිසරයට අදාළ වේ.

සමාජ පරිසරය : ජාතික උරුමයන් පිළිබඳ අවබෝධය, බහුවාර්ගික සමාජයක සාමාජිකයන් වීම හා සම්බන්ධ සංවේදීතාව හා කුසලතා, සාධාරණ යුක්තිය පිළිබඳ හැඟීම, සමාජ සම්බන්ධතා, පෞද්ගලික චර්යාව, සාමාන්‍ය හා නෛතික සම්ප්‍රදායයන්, අයිතිවාසිකම්, වගකීම්, යුතුකම් සහ බැඳීම්

ජෛව පරිසරය : සජීවී ලෝකයක, ජනතාව සහ ජෛව පද්ධතිය, ගස් වැල්, වනාන්තර, මුහුද, ජලය, වාතය සහ ජීවය - ශාක, සත්ත්ව හා මිනිස් ජීවිතයට සම්බන්ධ වූ අවබෝධය, සංවේදී බව හා කුසලතා

භෞතික පරිසරය: අවකාශය, ශක්තිය, ඉන්ධන, ද්‍රව්‍ය, භාණ්ඩ සහ මිනිස් ජීවිතයට ඒවායේ ඇති සම්බන්ධතාව, ආහාර, ඇඳුම්, නිවාස, සෞඛ්‍ය, සුව පහසුව, ශ්වසනය, නින්ද, නිස්කලංකය, විවේකය, අපද්‍රව්‍ය සහ මලපහ කිරීම යනාදිය හා සම්බන්ධ වූ අවබෝධය, සංවේදිතාව හා කුසලතාව. ඉගෙනීම, වැඩ කිරීම සහ ජීවත් වීම සඳහා මෙවලම් සහ තාක්ෂණය ප්‍රයෝජනයට ගැනීමේ කුසලතා මෙහි අඩංගු වේ.

(IV) වැඩ ලෝකයට සූදානම් වීමේ නිපුණතා

ආර්ථික සංවර්ධනයට දායක වීම.
තම වෘත්තීය ලැදියා සහ අභියෝග්‍යතා හඳුනා ගැනීම.
හැකියාවනට සරිලන අයුරින් රැකියාවක් තෝරා ගැනීම සහ
වාසිදායක හා තිරසර ජීවනෝපායක නිරත වීම.
යන හැකියාවන් උපරිම කිරීමට හා ධාරිතාව වැඩි කිරීමට අදාළ සේවා නියුක්තිය හා සම්බන්ධ කුසලතා



(V) ආගම සහ සදාචාර ධර්මයන්ට අදාළ නිපුණතා

පුද්ගලයන්ට තම දෛනික ජීවිතයේ දී ආචාර ධර්ම, සදාචාරාත්මක හා ආගමානුකූල හැසිරීම් රටාවන්ට අනුගත වෙමින් වඩාත් උචිත දේ තෝරා එයට සරිලන සේ කටයුතු කිරීම සඳහා අගයයන් උකහා ගැනීම හා ස්වීයකරණය

(VI) ක්‍රීඩාව සහ විවේකය ප්‍රයෝජනයට ගැනීමේ නිපුණතා

සෞන්දර්යය, සාහිත්‍යය, සෙල්ලම් කිරීම, ක්‍රීඩා හා මලල ක්‍රීඩා, විනෝදාංශ හා වෙනත් නිර්මාණාත්මක ජීවන රටාවන් තුළින් ප්‍රකාශ වන විනෝදය, සතුට, ආවේග සහ එවන් මානුෂික අත්දැකීම්

(VII) "ඉගෙනීමට ඉගෙනුම" පිළිබඳ නිපුණතා

ශීඝ්‍රයෙන් වෙනස් වන සංකීර්ණ හා එකිනෙකා මත යැපෙන ලෝකයක පරිවර්තන ක්‍රියාවලියක් හරහා වෙනස්වීම් හසුරුවා ගැනීමේ දී හා ඊට සංවේදී ව හා සාර්ථක ව ප්‍රතිචාර දැක්වීමත් ස්වාධීන ව ඉගෙන ගැනීමත් සඳහා පුද්ගලයන්ට ශක්තිය ලබා දීම.

(ජාතික අධ්‍යාපන කොමිෂන් වාර්තාව 2003)

## හින්දී භාෂාව විෂය අධ්‍යයනයේ අරමුණු

01. විදේශ භාෂාවක් ලෙස හින්දී භාෂාව අවබෝධය, කථා කිරීම, ලිවීම, කියවීම හා ඒ මගින් අන්තර්ජාතික ප්‍රජාව අතර සුවිශේෂ ස්ථානයක් හිමි කර ගැනීම.

02. සන්නිවේදන කුසලතා සංවර්ධනය කර ගැනීම හා එමගින් අන්තර්ජාතික සබඳතා ඇති කර ගැනීම.

03. හින්දී වාංමාලාව හා හින්දී බසෙහි ව්‍යාකරණ රටා ඉගෙනීම.

04. හින්දී භාෂාව ස්වභාෂාවට පරිවර්තනය කිරීමෙන් සහ ස්වභාෂාව හින්දී භාෂාවට පරිවර්තනය කිරීමෙන් පරිවර්තන හැකියාව වර්ධනය කර ගැනීම.

05. ඉන්දියානු ජන ජීවිතය සහ සමාජ සංස්කෘතික ලක්ෂණ පිළිබඳ දැනුම ලබා ගැනීම, එමගින් සංස්කෘතික විවිධත්වය අවබෝධ කර ගැනීම හා විචාරශීලී චින්තනය සංවර්ධනය කර ගැනීම.

06. විදේශ භාෂාවක් ලෙස හින්දී භාෂා අධ්‍යයන ක්‍රමවේද සංවර්ධනය.

07. සාහිත්‍ය රසාස්වාදනය කිරීම.

## ජාතික පොදු අරමුණු සහ විෂය අධ්‍යයනයේ අරමුණු අතර සම්බන්ධතාව දැක්වෙන වගුව (හින්දි)

| ජාතික පොදු අරමුණු | විෂය අරමුණු |
|---|---|
| 1, 3, 4, 6 | 01. විදේශ භාෂාවක් ලෙස හින්දි භාෂාව අවබෝධය, කථා කිරීම, ලිවීම, කියවීම හා ඒ මගින් අන්තර්ජාතික ප්‍රජාව අතර සුවිශේෂ ස්ථානයක් හිමි කර ගැනීම. |
| 1, 3, 4, 6 | 02. සන්නිවේදන කුසලතා සංවර්ධනය කර ගැනීම හා එමගින් අන්තර්ජාතික සබඳතා ඇති කර ගැනීම. |
| 1, 2, 5, 6, 8 | 03. හින්දි වාංමාලාව හා හින්දි බසෙහි ව්‍යාකරණ රටා ඉගෙනීම. |
| 5, 6, 7, 8 | 04. හින්දි භාෂාව ස්වභාෂාවට පරිවර්තනය කිරීමෙන් සහ ස්වභාෂාව හින්දි භාෂාවට පරිවර්තනය කිරීමෙන් පරිවර්තන හැකියාව වර්ධනය කර ගැනීම. |
| 2, 4, 5, 7 | 05. ඉන්දියානු ජන ජීවිතය සහ සමාජ සංස්කෘතික ලක්ෂණ පිළිබඳ දැනුම ලබා ගැනීම, එමගින් සංස්කෘතික විවිධත්වය අවබෝධ කර ගැනීම හා විචාරශීලී චින්තනය සංවර්ධනය කර ගැනීම. |
| 2, 5, 6, 7 | 06. විදේශ භාෂාවක් ලෙස හින්දි භාෂා අධ්‍යයන ක්‍රමවේද සංවර්ධනය. |
| 4, 5, 6, 7, 8 | 07. සාහිත්‍ය රසාස්වාදනය කිරීම. |

## හින්දි - 13 ශ්‍රේණිය
## පාසල් වාර වශයෙන් බෙදා ගැනීමට යෝජිත සැලසුම

| ශ්‍රේණිය | වාරය | නිපුණතා මට්ටම | කාලච්ඡේද සංඛ්‍යාව |
|---|---|---|---|
| 13 | I | 1.1, 1.2<br>2.1, 2.2,<br>3.1, 3.2<br>4.1, 4.2, 5.1 | 100 |
| | II | 5.1<br>6.1, 6.2, 7.1<br>8.1, 8.2, 9.1 | 100 |
| | III | 5 2, 7.2<br>9.2, 9.3<br>10.1, 10.2 | 100 |

13 ශ්‍රේණිය

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 1.0 හින්දී භාෂක කලාපය හඳුනා ගනියි. | 1.1 භාරතයේ ව්‍යවහාර වන භාෂා නම් කරයි. | • භාරතයේ ප්‍රාන්ත හා සාංගමික රාජ්‍ය, ඒවායෙහි භාවිත ප්‍රධාන භාෂා | • හින්දියේ ප්‍රධාන උපභාෂා නම් කරයි.<br>• එක් එක් ප්‍රාන්තයේ ව්‍යවහාර කෙරෙන ප්‍රධාන භාෂාව නම් කරයි. | 02 |
| | 1.2 හින්දී භාෂක කලාපයේ උපභාෂා නම් කරයි. | • හින්දී භාෂක කලාපයේ ප්‍රධාන උපභාෂා 5 | • හින්දී භාෂාව, සංස්කෘත භාෂාවෙන් විකාසය වූ නූතන ඉන්දු ආර්ය භාෂාවක් බව ප්‍රකාශ කරයි. | 03 |
| 2.0 හින්දී භාෂාව නිවැරදි ව උච්චාරණය කරයි. | 2.1 සරල ගද්‍ය පාඨ නිවැරදි ව උච්චාරණය කරයි. | • සරල ගද්‍ය පාඨ | • ආඝාතය සහ අනුතාන සහිත ව ගද්‍ය පාඨ උච්චාරණය කරයි.<br>• පද්‍ය පාඨ රිද්මානුකූල ව උච්චාරණය කරයි. | 10 |
| | 2.2 සරල පද්‍ය පාඨ නිවැරදි ව උච්චාරණය කරයි. | • සරල පද්‍ය පාඨ | | 10 |
| 3.0 සම්මත හින්දී භාෂාව නිවැරදි ව ලියයි. | 3.1 සරල රචනා සහ ලිපි ලියයි. | • රචනාඃ දෙන ලද මාතෘකාවක් යටතේ රචනා ලිවීම.<br>• ලිපිඃ දෙන ලද උපදෙස්වලට අනුව පෞද්ගලික ලිපි ලිවීම. (මිතුරු-මිතුරු, දෙමවුපිය - දූදරු, ගුරු-ශිෂ්‍ය) | • මාතෘකාවට අදාළ ව ලියයි.<br>• ව්‍යාකරණ රීතීන් අනුගත ව ලියයි.<br>• අදහස් නිරවුල් ව සංවිධානාත්මක ව ඉදිරිපත් කරයි.<br>• ප්‍රමාණාත්මක ව කරුණු ඉදිරිපත් කරයි.<br>• නිවැරදි ආකෘතියට අනුව ලිපි හා රචනා ලියයි. | 20 |
| | 3.2 කථාන්තර නිර්මාණය කරයි. | • දෙන ලද සැකිල්ලකට අනුව කථාන්තර ලිවීම. | • සැකිල්ල අවබෝධ කර ගෙන කථාවක් නිර්මාණය කරයි. | 16 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 4.0 සවන් දී අර්ථය නිවැරදි ව අවබෝධ කර ගෙන ප්‍රතිචාර දක්වයි. | 4.1 සරල ඡේදයකට සවන් දී අර්ථාවබෝධ කර ගනියි. | • සරල ඡේද ආශ්‍රයයෙන් ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු සැපයීම<br>• කථාන්තර | • සරල ඡේද ආශ්‍රයයෙන් ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු සපයයි.<br>• නිවැරදි පිළිතුර තෝරයි.<br>• හරි වැරදි ලකුණු කරයි.<br>• සරල ඡේදයකට හෝ කථාන්තරයකට හෝ සවන් දී වාචික ව හා ක්‍රියාවෙන් ප්‍රතිචාර දක්වයි. | 12 |
| | 4.2 සරල පද්‍යයකට සවන් දී අර්ථාවබෝධ කර ගනියි. | • සරල පද්‍ය | • සරල පද්‍ය ආශ්‍රයයෙන් ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු සපයයි.<br>• සරල පද්‍යයකට සවන් දී වාචික ව හා ක්‍රියාවෙන් ප්‍රතිචාර දක්වයි. | 12 |
| 5.0 නිවැරදි ව හා පැහැදිලි ව භාෂණයේ යෙදෙයි. | 5.1 සංවාදයේ යෙදෙයි. | • වෙළඳපොළේ දීː පලතුරු, එළවලු, පොත්, රෙදි ආදි වෙළෙඳසැල්වල දී භාවිත වන සරල දෙබස්<br>• විවිධ ස්ථානවල දීː තැපැල්හල, දුම්රිය ස්ථානය, බැංකුව, හෝටලය<br>• මිතුරකු, ගුරුතුමා සහ වෛද්‍යවරයා සමඟ<br>• යම්කිසි ස්ථානයකට පිවිසෙන මාර්ගය පිළිබඳ විමසීම සහ පිළිතුරු දීම.<br>• පෞද්ගලික සහ රාජකාරි කටයුතු සඳහා දූරකථනයෙන් සංවාදයේ යෙදීම. | • ස්ථානවලට අදාළ වචන භාවිත කරයි.<br>• අදාළ ස්ථානයේ දී සුදුසු භාෂා යෙදුම් භාවිත කරයි.<br>• සංවාදයේ යෙදෙයි. | 20 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 5.2 අවස්ථානුකූල ව කථා පවත්වයි. | • පිළිගැනීමේ කථාව<br>• ස්තුති කථාව<br>• දෙන ලද සරල මාතෘකාවකට අනුව කතා කිරීම. | • අවස්ථාව නිවැරදි ව අවබෝධ කරගෙන අවසර ගනියි. ආමන්ත්‍රණය කරයි.<br>• මාතෘකානුකූල ව කරුණු ගොනු කර ප්‍රකාශ කරයි.<br>• අදහස් සංවිධානාත්මක ව පෙළ ගස්වා ඉදිරිපත් කරයි.<br>• ව්‍යක්ත ලෙස කතා කරයි. | 15 |
| 6.0 සම්මත වියරණ සහ භාෂා ප්‍රයෝග නිවැරදි ව භාවිත කරයි. | 6.1 අව්‍ය පිළිබඳ අවබෝධය ලබයි. | • සම්බන්ධ සූචක, සමුච්චයබෝධක, විස්මයාදිබෝධක, ක්‍රියා විශේෂණ | • සම්බන්ධ සූචක අව්‍ය පද නිවැරදි ව භාවිත කරයි.<br>• සමුච්චයබෝධක අව්‍ය පද නිවැරදි ව භාවිත කරයි.<br>• විස්මයාදිබෝධක අව්‍ය පද නිවැරදි ව භාවිත කරයි.<br>• ක්‍රියා විශේෂණ නිවැරදි ව භාවිත කරයි. | 20 |
| | 6.2 කෘදන්ත පිළිබඳ අවබෝධය ලබයි. | • කෘදන්ත - විකාරී සහ අවිකාරී කෘදන්ත | • කෘදන්ත පද විකාරී හා අවිකාරී වශයෙන් මූලික ප්‍රභේද දෙකක් ඇති බව හඳුනාගෙන ප්‍රකාශ කරයි.<br>• කෘදන්ත ප්‍රභේද හඳුනා ගෙන භාවිත කරයි. | 15 |
| 7.0 කියවා ප්‍රතිචාර දක්වයි. | 7.1 චිත්‍ර සටහන් විස්තර කරයි. | • සරල අදහස් ප්‍රකාශ කෙරෙන පින්තූර | • පින්තූරයෙහි දැක්වෙන රූප හා ක්‍රියා විස්තර කරයි.<br>• ව්‍යාකරණ රීතීන් අනුව වාක්‍ය ගොඩ නගයි.<br>• වාක්‍ය නිවැරදි ව උච්චාරණය කරයි. | 10 |
| | 7.2 සරල ඡේද හා පද්‍ය කොටස් කියවා විස්තර කරයි. | • සරල ඡේද හා පද්‍ය කොටස් | • ගද්‍ය සහ පද්‍යපාඨ නිශ්ශබ්ද ව කියවයි.<br>• අවබෝධයෙන් පිළිතුරු සපයයි.<br>• අර්ථය සරල හින්දියෙන් ප්‍රකාශ කරයි. | 20 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 8.0 පරිවර්තනය කරයි. | 8.1 හින්දී ගද්‍ය පාඨ සිංහල/දෙමළ/ ඉංග්‍රීසි භාෂාවට පරිවර්තනය කරයි. | • හින්දී ගද්‍ය පාඨ/සංවාද සහ ඒ හා සමාන මට්ටමේ වෙනත් ගද්‍ය පාඨ පරිවර්තනය කිරීම. | • දී ඇති හින්දී ගද්‍ය පාඨය අවධානයෙන් කියවයි.<br>• ගද්‍ය පාඨයෙහි අර්ථය අවබෝධ කර ගෙන පරිවර්තනය කරයි. | 15 |
| | 8.2 සිංහල/දෙමළ/ඉංග්‍රීසි ගද්‍ය පාඨ හින්දී භාෂාවට පරිවර්තනය කරයි. | • සිංහල/දෙමළ/ඉංග්‍රීසි සරල ගද්‍ය පාඨ/සංවාද හින්දී භාෂාවට පරිවර්තනය කිරීම. | • දී ඇති සිංහල/දෙමළ/ඉංග්‍රීසි ගද්‍යපාඨය අවධානයෙන් කියවයි.<br>• ගද්‍ය පාඨයෙහි අර්ථය අවබෝධ කර ගෙන පරිවර්තනය කරයි. | 15 |
| 9.0 හින්දී සාහිත්‍යාංග රස විඳිමින් අන්තර්ගත හරධර්ම චරිතායනය කරයි. | 9.1 හින්දී සාහිත්‍යාංග රස විඳියි. | • ගද්‍ය පාඨ සහ පද්‍ය පාඨ | • හින්දී ගද්‍ය, පද්‍ය කියවයි.<br>• දුරවබෝධ පද අවබෝධ කර ගෙන ගද්‍ය/ පද්‍යවල අර්ථය ප්‍රකාශ කරයි.<br>• අවස්ථා සම්බන්ධය දක්වයි. | 20 |
| | 9.2 භාරතයේ ශ්‍රේෂ්ඨ පුද්ගල චරිත හඳුනා ගනියි. | • පුද්ගල චරිත | • බුදුන් වහන්සේ, මහත්මා ගාන්ධි වැනි ශ්‍රේෂ්ඨ චරිත විස්තර කරයි.<br>• එම චරිත ආශ්‍රයෙන් ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු සපයයි. | 15 |
| | 9.3 හින්දී සාහිත්‍යාංග ඇසුරින් උත්තර භාරතීය සංස්කෘතිය හඳුනා ගනියි. | • ආහාර-පාන, ඇඳුම්-පැලැඳුම්, කෙළි-සෙල්ලම් සහ උත්සව | • උත්තර භාරතීය ආහාර-පාන නම් කරයි.<br>• උත්තර භාරතීය ඇඳුම්-පැලැඳුම් නම් කරයි.<br>• උත්තර භාරතීය උත්සව නම් කරයි.<br>• උත්තර භාරතීය ක්‍රීඩා (කෙළි-සෙල්ලම්) නම් කරයි. | 20 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 10.0 නූතන හින්දී සාහිත්‍ය ඉතිහාසය පිළිබඳ මූලික අවබෝධය ලබයි. | 10.1 නූතන හින්දී සාහිත්‍යයේ එන සාහිත්‍යකරුවන් හඳුනා ගනියි.<br><br>10.2 නූතන හින්දී සාහිත්‍යයේ එන සාහිත්‍යකරුවන්ගේ නිර්මාණ හඳුනා ගනියි. | • භාරතේන්දු හරිශ්චන්ද්‍ර, මහාවීර් ප්‍රසාද් ද්විවේදී, මැථිලීශරණ් ගුප්ත්, ජයශංකර් ප්‍රසාද්, සුමිත්‍රානන්දන් පන්ත්, සූර්යකාන්ත් ත්‍රිපාඨී 'නිරාලා', මහාදේවී වර්මා, ප්‍රේම්චන්ද්, යශ්පාල්, අම්රිත්ලාල් නාගර්, විෂ්ණු ප්‍රභාකර්, විශ්වම්බර්නාථ් ශර්මා ආදි සාහිත්‍යකරුවන් සහ ඔවුන්ගේ නිර්මාණ පිළිබඳ අවබෝධය ලබා ගැනීම. | • සාහිත්‍යධරයන් නම් කරයි.<br>• ඔවුන්ගේ නිර්මාණ නම් කරයි.<br>• සාහිත්‍යධරයන්ගේ සේවාව විස්තර කරයි. | 15<br><br>15 |

## නිර්දිෂ්ට ග්‍රන්ථ :


**මන්ථන් හින්දී පාඨාවලී** (2010) සරස්වතී හවුස් ප්‍රයිවෙට් ලිමිටඩ්, නවදිල්ලී.

**භාෂා භාරතී භාග්** 1 (2007) හාර් කී ජීත් - සුදර්ශන් සහ දුබ් කා අධිකාර්- යශ්පාල්, යුනයිටඩ් පබ්ලිෂින්ග් හවුස්, නවදිල්ලී.

**නූතන හින්දී සාහිත්‍ය ඉතිහාසය** (2009) (සංශෝධිත සංස්කරණය), උපුල් රංජිත් හේවාවිතානගමගේ.


## පරිශීලන ග්‍රන්ථ :


**බාල් හින්දී ව්‍යාකරණ් තථා රචනා**', ගෝයල් බ්‍රදර්ස් ප්‍රකාශන්, නව දිල්ලී.

'**කථා සරිතා**' (භාග් 3, 4), දිවාකර් පාණ්ඩේය, ගෝයල් බ්‍රදර්ස් ප්‍රකාශන්, නව දිල්ලී.

'**හින්දී වියරණ හුරුව**' (2005, 2008 පළමු සංස්කරණය) ලක්ෂ්මන් සෙනෙවිරත්න, සමයවර්ධන ග්‍රන්ථ ප්‍රකාශකයෝ, කොළඹ 10.

'**හින්දී ලේඛන හුරුව**' (2008) ලක්ෂ්මන් සෙනෙවිරත්න, කර්තෘ ප්‍රකාශනයකි.

'**හින්දී කථන හුරුව**' (2010) ඉන්ද්‍රා දසනායක, ලක්ෂ්මන් සෙනෙවිරත්න, සමයවර්ධන ග්‍රන්ථ ප්‍රකාශකයෝ, කොළඹ 10.

## ඉගෙනුම් සහ ඉගැන්වීම් ක්‍රමෝපාය

4.1 ලේඛනය සහ උච්චාරණය හුරු කිරීම සඳහා

4.1.1 කණ්ඩායම් වශයෙන් වෙන් කොට උච්චාරණයට අදාළ ශබ්ද හඳුනා ගැනීමට සැලැස්වීම.

4.1.2 කියවන විට ලිවීම.

4.1.3 ශ්‍රව්‍ය-දෘශ්‍ය මාධ්‍යයන් ඇසුරෙන් උච්චාරණ විශේෂතා අධ්‍යයනය කිරීමට සැලැස්වීම.

4.1.4 කණ්ඩායම් වශයෙන් හෝ තනි තනිව ම හෝ වචනයට අදාළ රූපයත්, රූපයට අදාළ වචනයත් හඳුනා ගැනීමට සැලැස්වීම.

4.2 ව්‍යාකරණය

4.2.1 සෑම ව්‍යාකරණ පාඩමකට ම අදාළ ව විවිධ අභ්‍යාස කරවීම.

4.2.2 කණ්ඩායම් වශයෙන් හෝ තනි තනිව ම හෝ ඉගෙනගත් ව්‍යාකරණ පාඩම් සිසුන් ලවා පැහැදිලි කිරීමට සැලැස්වීම.

4.3 සංවාද පුහුණුව

4.3.1 සිසුන්ගෙන් උත්තර බලාපොරොත්තුවෙන් ප්‍රශ්න ඇසීම.

4.3.2 උත්තරයට අදාළ ප්‍රශ්නය සිසුන් ලවා විමසවීම.

4.3.3 ක්ෂණික මාතෘකා යටතේ කෙටි වාක්‍ය නිර්මාණය කිරීම.

4.3.4 පින්තූර පෙන්වා විස්තර ඇසීම.

4.3.5 යුගල වශයෙන් හෝ කණ්ඩායම් වශයෙන හෝ සංවාද පුහුණු කිරීම.

4.4 පන්තිය තුළ ම හින්දී පොතපත කියවීම පුහුණු කිරීම සඳහා පුස්තකාලයයක් පවත්වාගෙන යෑම.

4.5 අන්තර්ජාලය පරිහරණයෙන් හින්දී භාෂා ඥානය වර්ධනය කර ගැනීම.

## පාසල් ප්‍රතිපත්ති හා වැඩසටහන්

හින්දී භාෂාව හැදෑරීමෙන් පසු එම දැනුම, කුසලතා හා නව ආකල්ප භාවිතයට ගනිමින් පාසලේ විෂය සමගාමී කටයුතු ලෙස පහත සඳහන් කාර්යයන් ක්‍රියාත්මක කළ හැකි වනු ඇත. එනම්,

5.1 **'විශ්ව හින්දී දිනය/හින්දී භාෂා දිනය'** සැමරීම.

5.2 ස්වනිර්මාණ ද ඇතුළත් **'හින්දී සගරාවක්'** නිර්මාණය කිරීම.

5.3 පාසලේ පැවැත්වෙන රැස්වීම්වල දී හින්දී බසින් ප්‍රවෘත්ති, කථා සහ ගීත ආදිය ඉදිරිපත් කිරීම.

5.4 උත්තර භාරතීය සංස්කෘතිය විදහා දැක්වෙන වැඩමුළු, ප්‍රදර්ශන ආදිය පැවැත්වීම.

5.5 පාසල තුළ හෝ අන්තර් පාඨශාලීය මට්ටමින් හෝ හින්දී බසින් රචනා, කවිය, ගීත නිර්මාණ, නාට්‍ය ආදි තරග පැවැත්වීම.

5.6 හින්දී භාෂාව පිළිබඳ ව වැඩිදුර දැනුමක් ලබා දීම සඳහා තද්විෂයය හා සම්බන්ධ වියතුන්ගේ සහභාගිත්වයෙන් සම්මන්ත්‍රණ පැවැත්වීම.

# තක්සේරුව හා ඇගයීම

- පාසල පදනම් කරගත් ඇගයීම් වැඩපිළිවෙළ යටතේ එක් එක් වාරය සඳහා නියමිත නිපුණතා හා නිපුණතා මට්ටම් ආවරණය වන පරිදි ඉගෙනුම්-ඉගැන්වීම් උපකරණ නිර්මාණාත්මක ව පිළියෙළ කොට ක්‍රියාත්මක කිරීම අපේක්ෂිත යි.

- 13 වන ශ්‍රේණිය අවසානයේදී ජාතික මට්ටමේ ඇගයීම වන අ. පො. ස. (උසස් පෙළ) විභාගය සඳහා මෙම විෂය නිර්දේශය නිර්දේශිත ය.

- මෙම විෂය නිර්දේශය පදනම් කර ගෙන ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මඟින් පවත්වනු ලබන ජාතික මට්ටමේ විභාගය 2019 වර්ෂයේ දී පැවැත්වේ.

- මෙම විභාගයේ ප්‍රශ්න පත්‍රවල ආකෘතිය හා ස්වභාවය පිළිබඳ අවශ්‍ය විස්තර විභාග දෙපාර්තමේන්තුව මඟින් සැපයෙනු ඇත.

# ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස්

## 13 ශ්‍රේණිය හින්දී

**නිපුණතාව** 1.0 හින්දී භාෂක කලාපය හඳුනා ගනියි.

**නිපුණතා මට්ටම** 1.1 භාරතයේ ව්‍යවහාර වන භාෂා නම් කරයි.
1.2 හින්දී භාෂා කලාපයේ උපභාෂා නම් කරයි.

**කාලච්ඡේද** 05

**ඉගෙනුම් පල**

- එක් එක් ප්‍රාන්තයේ ව්‍යවහාර වන ප්‍රධාන භාෂාව නම් කරයි.
- හින්දී භාෂාව මවු බස ලෙස ව්‍යවහාර කෙරෙන ප්‍රාන්ත හඳුනා ගෙන නම් කරයි.
- හින්දී භාෂාවේ උපභාෂා පහ හඳුනා ගෙන නම් කරයි.
- හින්දී භාෂාව, සංස්කෘත භාෂාවෙන් විකාශය වූ නූතන ඉන්දු ආර්ය භාෂාවක් බව කියයි.
- හින්දී භාෂාවේ ප්‍රාදේශික ව්‍යවහාර සංඛ්‍යාත්මක ව ප්‍රකාශ කරයි.

**විෂය කරුණුවල සංක්ෂිප්තය**

- භාරතයේ එක් එක් ප්‍රාන්තවල විවිධ භාෂා ව්‍යවහාර වන බව
- එක් එක් ප්‍රාන්තයට ප්‍රධාන වූ භාෂාවක් ඇති බව
- හින්දී භාෂාව ප්‍රාන්ත කිහිපයක ම ජනතාවගේ මවු බස වන බව
- හින්දී භාෂාව, සංස්කෘත භාෂාවෙන් විකාශනය වූ නූතන ඉන්දු ආර්ය භාෂාවක් වන බව
- පශ්චිමී හින්දී, පූර්වී හින්දී, පහාඩී හින්දී, බිහාරී හින්දී සහ රාජස්ථානී හින්දී හින්දී භාෂාවේ උප භාෂා වන බව
- එම උපභාෂා තුළ ප්‍රාදේශික ව්‍යවහාර 18ක් ඇති බව
- හින්දී භාෂාව භාරතයේ රාජ්‍ය භාෂාව වන බව

**යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය**

- භාරතයේ ප්‍රාන්ත අංකනය කොට නම් කරන ලද සිතියමක් සිසුන්ට ලබා දෙන්න.
- එක් එක් ප්‍රාන්තවල ව්‍යවහාර කෙරෙන ප්‍රධාන භාෂාව දැක්වෙන වගුවක් පන්තියේ ප්‍රදර්ශනය කරන්න.
- වගුව ඇසුරෙන් එක් එක් ප්‍රාන්තවල ව්‍යවහාර කෙරෙන භාෂා පිළිබඳ අවබෝධයක් සිසුන්ට ලබා දෙන්න.
- හින්දී භාෂාව ව්‍යවහාර කෙරෙන ප්‍රාන්ත එක් වර්ණයකින් සිතියමේ සේයා කිරීමට උපදෙස් දෙන්න.
- හින්දී භාෂාවේ විකාශය පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න.
- හින්දී භාෂාවේ උපභාෂා 05ක් සහ ප්‍රාදේශික ව්‍යවහාර 18ක් ඇති බව පැහැදිලි කර දෙන්න.

**ගුණාත්මක යෙදවුම්**

- භාරතයේ ප්‍රාන්ත අංකනය කරන ලද සිතියම්
- භාරතීය ප්‍රාන්ත භාෂා දැක්වෙන වගුවක්
- හින්දී භාෂාවේ උපභාෂා සහ ප්‍රාදේශික ව්‍යවහාර දැක්වෙන වගුවක්

**තක්සේරුව හා ඇගයීම් සඳහා නිර්ණායක**

- ප්‍රාන්තවල ප්‍රධාන භාෂාව නම් කරයි.
- දෙන ලද භාෂා ව්‍යවහාර වන ප්‍රාන්ත නම් කරයි.
- හින්දී භාෂක කලාපය සිතියමක සේයා කරයි.
- භාෂා ව්‍යවහාර පවතින ප්‍රාන්ත නම් කිරීමේ හැකියාව අගය කරයි.
- හින්දී භාෂාවේ ව්‍යාප්තිය සහ ප්‍රාදේශික ව්‍යවහාර ව්‍යාප්තිය පිළිබඳ දැනුම ප්‍රදර්ශනය කරයි.
- හින්දී භාෂක කලාප පිළිබඳ අවබෝධයෙන් යුතු ව ක්‍රියා කරයි.

**නිපුණතාව** 2.0 හින්දී භාෂාව නිවැරදි ව උච්චාරණය කරයි.

**නිපුණතා මට්ටම** 2.1 සරල ගද්‍ය පාඨ නිවැරදි ව උච්චාරණය කරයි.

**කාලච්ඡේද** 10

**ඉගෙනුම් පල**

- අල්පප්‍රාණ, මහප්‍රාණ භේදය පිළිබඳ සැලැකිලිමත් වෙමින් ගද්‍ය පාඨ උච්චාරණය කරයි.
- සරල ගද්‍ය පාඨ අර්ථ සන්නිවේදනය සඳහා ආඝාතය නිවැරදි ව භාවිත කරමින් උච්චාරණය කරයි.
- සරල ගද්‍ය පාඨ අර්ථ සන්නිවේදනය සඳහා අනුතානය සහිත ව නිවැරදි ව උච්චාරණය කරයි.
- උච්චාරණ විශේෂතා පිළිබඳ සැලැකිලිමත් වෙමින් ගද්‍ය පාඨ උච්චාරණය කරයි.

**විෂය කරුණුවල සංක්ෂිප්තය**

- ගද්‍ය පාඨ උච්චාරණයේ දී අල්පප්‍රාණ, මහප්‍රාණ භේදය ගැන සැලැකිලිමත් විය යුතු බව
- ගද්‍ය පාඨ උච්චාරණයේ උච්චාරණ විශේෂතා පිළිබඳ ව සැලැකිලිමත් විය යුතු බව
- නිවැරදි අර්ථ සන්නිවේදනය සඳහා ආඝාතය සහ අනුතානය යෝග්‍ය පරිදි භාවිත කළ යුතු බව

**යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය**

- නිර්දිෂ්ට ග්‍රන්ථයේ ගද්‍ය පාඨ කිහිපයක් උච්චාරණය කර පෙන්වන්න.
- උච්චාරණ විශේෂතා පිළිබඳ ව සිසුන් සමඟ සාකච්ඡා කරන්න.
- නිවැරදි අර්ථ සන්නිවේදනය සඳහා උච්චාරණ විශේෂතා සැලැකිල්ලට ගත යුතු බව පහදා දෙන්න.
- කේවල වශයෙන් ගද්‍ය පාඨ උච්චාරණය කිරීමේ අභ්‍යාස ලබා දෙන්න.

**ගුණාත්මක යෙදවුම්**

- නිර්දිෂ්ට ග්‍රන්ථය

**තක්සේරුව හා ඇගයීම් සඳහා නිර්ණායක**

- නිවැරදි උච්චාරණය සඳහා අල්පප්‍රාණ, මහප්‍රාණ භේදය සැලැකිල්ලට ගත යුතු බව ප්‍රකාශ කරයි.
- විශේෂතා සැලැකිල්ලට ගෙන උච්චාරණය කිරීම අගය කරයි.
- ආඝාතය යෝග්‍ය පරිදි භාවිත කරමින් උච්චාරණය කරයි.
- අනුතානය යෝග්‍ය පරිදි භාවිත කරමින් උච්චාරණය කරයි.
- නිවැරදි ව උච්චාරණයේ යෙදෙමින් ගද්‍ය පාඨ කියවයි.

**නිපුණතාව** 2.0 හින්දී භාෂාව නිවැරදි ව උච්චාරණය කරයි.

**නිපුණතා මට්ටම** 2.2 සරල පද්‍ය පාඨ නිවැරදි ව උච්චාරණය කරයි.

**කාලච්ඡේද** 10

**ඉගෙනුම් පල**

- පද්‍ය පාඨය රිද්මානුකූල ව උච්චාරණය කරයි.
- අල්පප්‍රාණ සහ මහප්‍රාණ භේදය පිළිබඳ ව සැලැකිලිමත් වෙමින් පද්‍ය පාඨ උච්චාරණය කරයි.
- උච්චාරණ විශේෂතා පිළිබඳ සැලැකිලිමත් වෙමින් පද්‍ය පාඨ උච්චාරණය කරයි.

**විෂය කරුණුවල සංක්ෂිප්තය**

- පද්‍ය පාඨ රිද්මානුකූල ව උච්චාරණය කළ යුතු බව
- අල්පප්‍රාණ, මහප්‍රාණ භේදය පිළිබඳ සැලැකිලිමත් වෙමින් පද්‍ය පාඨ උච්චාරණය කළ යුතු බව
- උච්චාරණ විශේෂතා පිළිබඳ සැලැකිලිමත් වෙමින් පද්‍ය පාඨ උච්චාරණය කළ යුතු බව

**යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය**

- නිර්දිෂ්ට ග්‍රන්ථයේ පද්‍ය පාඨ කිහිපයක් රිද්මානුකූල ව උච්චාරණය කර පෙන්වන්න.
- පද්‍ය පාඨ උච්චාරණයේ දී ද, අල්පප්‍රාණ මහප්‍රාණ භේදය සහ උච්චාරණ විශේෂතා සැලැකිල්ලට ගත යුතු බව.
- කේවල හෝ කණ්ඩායම් හෝ වශයෙන් පද්‍ය පාඨ උච්චාරණය කිරීමේ අභ්‍යාස ලබා දීම.

**ගුණාත්මක යෙදවුම්**

- නිර්දිෂ්ට ග්‍රන්ථය

**තක්සේරුව හා ඇගයීම් සඳහා නිර්ණායක**

- රිද්මානුකූල ව උච්චාරණය කරයි.
- අල්පප්‍රාණ, මහප්‍රාණ භේදය පිළිබඳ ව සැලකිලිමත් වෙමින් උච්චාරණය කිරීමේ හැකියාව අගය කරයි.
- උච්චාරණ විශේෂතා සැලැකිල්ලට ගෙන උච්චාරණය කරයි.
- සරල පද්‍ය ගායනය කරයි.

**නිපුණතාව** 3.0 සම්මත හින්දී භාෂාව නිවැරදි ව ලියයි.

**නිපුණතා මට්ටම** 3.1 සරල රචනා සහ ලිපි ලියයි.

**කාලච්ඡේද** 20

**ඉගෙනුම් පල**

- මාතෘකාවට අදාළ ව ලියයි.
- ව්‍යාකරණ රීතිවලට අනුගත ව ලියයි.
- අදහස් නිරවුල් ව සංවිධානාත්මක ව ඉදිරිපත් කරයි.
- ප්‍රමාණාත්මක ව කරුණු ඉදිරිපත් කරයි.
- නිවැරදි ආකෘතිය අනුව ලිපි සහ රචනා ලියයි.

**විෂය කරුණුවල සංක්ෂිප්තය**

- දී ඇති මාතෘකාවට අදාළ ව කරුණු ඉදිරිපත් කළ යුතු බව
- නිවැරදි ආකෘතිය අනුව කරුණු ඉදිරිපත් කළ යුතු බව
- නිවැරදි අක්ෂර වින්‍යාසය සහ ව්‍යාකරණ රීතීන් අනුව ලිවිය යුතු බව
- අදහස් නිරවුල් ව සංවිධානාත්මක ව ඉදිරිපත් කළ යුතු බව

**යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය**

- යෝග්‍ය ආදර්ශන මගින් සිසුන්ට රචනාවල හා ලිපිවල ආකෘතිය හඳුන්වා දෙන්න.
- රචනා සහ ලිපි ලිවීම සඳහා සරල මාතෘකා ලබා දෙන්න.
- රචනා සහ ලිපි ලිවීම සඳහා විවිධ මාතෘකාවලට අදාළ ව සහායක ශබ්දාවලියක් ලබා දෙන්න.
- රචනා සහ ලිපි ලිවීමේ දී නිවැරදි අක්ෂර වින්‍යාසය සහ නිවැරදි ව්‍යාකරණ රීති අනුගමනය කළ යුතු බව පහදා දෙන්න.
- නිර්මාණශීලි ව අදහස් ඉදිරිපත් කිරීමට යොමු කරවන්න.

**ගුණාත්මක යෙදවුම්**

- ආදර්ශ ලිපි සහ ආදර්ශ රචනා

**තක්සේරුව හා ඇගයීම් සඳහා නිර්ණායක**

- මාතෘකාවට අදාළ ව කරුණු ඉදිරිපත් කරයි.
- නිවැරදි ආකෘතියට අනුගත ලිවීම අගය කරයි.
- අක්ෂර වින්‍යාසය සහ ව්‍යාකරණ රීති නිවැරදි ව භාවිත කරයි.
- අවශ්‍යතා පරිදි ලිපි හා රචනා ලියයි.

**නිපුණතාව** 3.0 සම්මත හින්දී භාෂාව නිවැරදි ව ලියයි.

**නිපුණතා මට්ටම** 3.2 කථාන්තර නිර්මාණය කරයි.

**කාලච්ඡේද** 16

**ඉගෙනුම් පල**

- දී ඇති සැකිල්ල අනුව කථාව නිර්මාණය කරයි.
- වාක්‍ය නිවැරදි ව ගළපයි.
- නිර්මාණශීලී ව කථාව ගොඩ නගයි.

**විෂය කරුණුවල සංක්ෂිප්තය**

- දී ඇති සැකිල්ල අනුව කථාව ගොඩ නැඟිය යුතු බව
- අදහස් නිරවුල් ව ඉදිරිපත් කිරීම සඳහා වාක්‍ය නිවැරදි ව ගැළපිය යුතු බව
- කථා රසය ඉස්මතු වන පරිදි නිර්මාණශීලී ව කථාව ගොඩ නැඟිය යුතු බව

**යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය**

- දෙන ලද සැකිල්ල අනුව නිර්මාණය කරන ලද ආදර්ශ කථාන්තර කිහිපයක් සිසුන්ට ලබා දෙන්න.
- එම ආදර්ශ කථා සිසුන්ට පැහැදිලි කර දෙන්න.
- කිසියම් කථා සැකිල්ලක් ලබා දී කථාන්තරයක් නිර්මාණය කිරීමට යොමු කරවන්න.
- හින්දී භාෂා ශෛලියට අනුව වාක්‍ය ගොඩ නැගීමට උපදෙස් දෙන්න.

**ගුණාත්මක යෙදවුම්**

- ආදර්ශ කථාන්තර

**තක්සේරුව හා ඇගයීම් සඳහා නිර්ණායක**

- දී ඇති සැකිල්ල අනුව කථාව ගොඩනගයි.
- නිවැරදි ව භාෂාව භාවිත කිරීම අගය කරයි.
- නිර්මාණශීලී ව ලියයි.

**නිපුණතාව** 4.0 සවන් දී අර්ථය නිවැරදි ව අවබෝධ කර ගෙන ප්‍රතිචාර දක්වයි.

**නිපුණතා මට්ටම** 4.1 සරල ඡේදයකට සවන් දී අර්ථාවබෝධ කර ගනියි.

**කාලච්ඡේද** 12

**ඉගෙනුම් පල**

- සරල ඡේද ඇසුරෙන් ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු සපයයි.
- නිවැරදි පිළිතුරු තෝරයි.
- හරි වැරදි ලකුණු කරයි.
- සරල ඡේදයකට හෝ කතාවකට හෝ සවන් දී වාචික ව ප්‍රතිචාර දක්වයි.

**විෂය කරුණුවල සංක්ෂිප්තය**

- ඉදිරිපත් කරනු ලබන ගද්‍ය පාඨයට අවධානයෙන් සවන් දිය යුතු බව
- අසනු ලබන ප්‍රශ්න නිවැරදි ව අවබෝධ කර ගත යුතු බව
- අසනු ලබන ප්‍රශ්නවලට නිවැරදි ව පිළිතුරු ලබා දිය යුතු බව

**යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය**

- ඉදිරිපත් කරනු ලබන ගද්‍ය පාඨයට අදාළ ප්‍රශ්නාවලියක් සිසුන්ට ලබා දෙන්න.
- එම ප්‍රශ්නාවලිය කියවා අවබෝධ කර ගැනීමට අවස්ථාව ලබා දෙන්න.
- අදාළ ගද්‍ය පාඨය ඉදිරිපත් කරන්න.
- වාචික ව ද ප්‍රශ්න විමසන්න, පිළිතුර ලබා ගන්න.
- ඉදිරිපත් කරනු ලබන ගද්‍ය පාඨයේ සමස්ත අර්ථය, සිසුන් සමඟ සාකච්ඡා කරන්න.

**ගුණාත්මක යෙදවුම්**

- සුදුසු ගද්‍යාංශ
- හඬපට
- ප්‍රශ්නාවලී

**තක්සේරුව හා ඇගයීම් සඳහා නිර්ණායක**

- ගද්‍ය පාඨයට සවන් දී අර්ථය ප්‍රකාශ කරයි.
- නිවැරදි ව අර්ථය දැක්වීම අගය කරයි.
- ගද්‍ය පාඨවලට සවන් දී අදහස් ඉදිරිපත් කරයි.
- සවන් දී අදහස් ප්‍රකාශ කරයි.

**නිපුණතාව** 4.0 සවන් දී අර්ථය නිවැරදි ව අවබෝධ කර ගෙන ප්‍රතිචාර දක්වයි.

**නිපුණතා මට්ටම** 4.2 සරල පද්‍යයකට සවන් දී අර්ථාවබෝධ කර ගනියි.

**කාලච්ඡේද** 12

**ඉගෙනුම් පල**

- සරල පද්‍යයකට සවන් දී අසනු ලබන ප්‍රශ්නවලට පිළිතුර සපයයි.
- නිවැරදි පිළිතුරු තෝරයි.
- හරි වැරදි ලකුණු කරයි.
- වාචික ව පිළිතුරු සපයයි.

**විෂය කරුණුවල සංක්ෂිප්තය**

- ඉදිරිපත් කරනු ලබන පද්‍ය පාඨයට අවධානයෙන් සවන් දිය යුතු බව
- අසනු ලබන ප්‍රශ්න නිවැරදි ව අවබෝධ කර ගත යුතු බව
- අසනු ලබන ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු ලබා දිය යුතු බව

**යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය**

- ඉදිරිපත් කරනු ලබන පද්‍ය පාඨයට අදාළ ප්‍රශ්නාවලියක් සිසුන්ට ලබා දෙන්න.
- එම ප්‍රශ්නාවලිය කියවා අවබෝධ කර ගැනීමට අවස්ථාව ලබා දෙන්න.
- අදාළ පද්‍ය පාඨය ඉදිරිපත් කරන්න.
- වාචික ව ද ප්‍රශ්න විමසන්න, පිළිතුරු ලබා ගන්න.
- ඉදිරිපත් කරනු ලබන පද්‍ය පාඨයේ සමස්ත අර්ථය, සිසුන් සමඟ සාකච්ඡා කරන්න.

**ගුණාත්මක යෙදවුම්**

- සුදුසු පද්‍ය
- හඬපට
- ප්‍රශ්නාවලී

**තක්සේරුව හා ඇගයීම් සඳහා නිර්ණායක**

- පද්‍ය පාඨයට සවන් දී අර්ථය ඉදිරිපත් කරයි.
- නිරවද්‍ය අදහස් අගය කරයි.
- පද්‍යයකට සවන් දී අදහස් ප්‍රකාශ කරයි.
- අර්ථාවබෝධයෙන් යුතු ව පද්‍යවලට සවන් දෙයි.

**නිපුණතාව** 5.0 නිවැරදි ව හා පැහැදිලි ව භාෂණයේ යෙදෙයි.

**නිපුණතා මට්ටම** 5.1 සංවාදයේ යෙදෙයි.

**කාලච්ඡේද** 20

**ඉගෙනුම් පල**

- සංවාද මාතෘකාවට අදාළ වචන භාවිත කරයි.
- අදාළ ස්ථානයට සුදුසු භාෂා යෙදුම් භාවිත කරයි.
- විවිධ මාතෘකා යටතේ සංවාද ගොඩ නගයි.
- සජීව ලෙස සංවාදයෙහි යෙදෙයි.

**විෂය කරුණුවල සංක්ෂිප්තය**

- සංවාද මාතෘකාවට අදාළ වාක්කෝෂ ඥානය ලබා ගත යුතු බව
- සංවාද මාතෘකාවට අදාළ විශේෂ භාෂා යෙදුම් භාවිත කළ යුතු බව
- නිවැරදි ආකෘතියකට අනුව සංවාද ගොඩනැඟිය යුතු බව
- සජීව ලෙස සංවාදයේ යෙදිය යුතු බව

**යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය**

- විවිධ ස්ථානවල දී, විවිධ පුද්ගලයන් සමඟ සහ දූරකථන සංවාද සඳහා යෝග්‍ය ආදර්ශන සිසුන්ට ලබා දෙන්න.
- යුගල හෝ කණ්ඩායම් හෝ වශයෙන් සංවාදයේ යෙදීමට අවස්ථාව ලබා දෙන්න.
- ලබා දී ඇති ආදර්ශන ඇසුරු කර ගනිමින් විවිධ මාතෘකා අනුව සංවාද ගොඩනැඟීමට උපදෙස් ලබා දෙන්න.
- පන්ති කාමරයේ දී එම සංවාද ඉදිරිපත් කිරීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
- අවශ්‍ය භාෂා යෙදුම් හා වාක්කෝෂ ඥානය ලබා දෙන්න.

**ගුණාත්මක යෙදවුම්**

- විවිධ මාතෘකා අනුව නිර්මාණය කරන ලද සංවාද
- හඬපට

**තක්සේරුව හා ඇගයීම් සඳහා නිර්ණායක**

- දෙන ලද මාතෘකාවට අදාළ ව සංවාදය ගොඩනගයි.
- නිවැරදි ආකෘතියට අනුව සංවාදය ගොඩනැඟීම අගය කරයි.
- අවස්ථාවට යෝග්‍ය භාෂා යෙදුම් භාවිත කරයි.
- සජීව ලෙස සංවාද ඉදිරිපත් කරයි.
- මාතෘකාවට අදාළ සංවාද සඳහා උචිත වචන භාවිත කිරීමේ අවශ්‍යතාව පැහැදිලි කරයි.

**නිපුණතාව** 5.0 නිවැරදි ව හා පැහැදිලි ව භාෂණයේ යෙදෙයි.

**නිපුණතා මට්ටම** 5.2 අවස්ථානුකූල ව කථා පවත්වයි.

**කාලච්ඡේද** 15

**ඉගෙනුම් පල**

- ආමන්ත්‍රණ විධි හඳුනා ගෙන කියයි.
- පිළිගැනීමේ කථාවක දී යෙදෙන භාෂා යෙදුම් හඳුනා ගෙන භාවිත කරයි.
- ස්තුති කථාවක දී යෙදෙන භාෂා යෙදුම් හඳුනා ගෙන භාවිත කරයි.
- දෙන ලද සරල මාතෘකාවකට අදාළ ව කථා කරයි.

**විෂය කරුණුවල සංක්ෂිප්තය**

- සභාවක් ඇමතීමේ දී नमस्कार, सादर प्रणाम වැනි යෙදුම් භාවිත වන බව
- පැමිණ සිටින පිරිස අනුව සභාව ආමන්ත්‍රණය කිරීමේ විධි වෙනස් වන බව

  ආමන්ත්‍රණ විධි :-

  පූජ්‍ය පක්ෂයට - भंते गण

  අමුත්තන් සඳහා - उपस्थित सभी अतिथि गण

  විදුහල්පතිට - आदरणीय प्रधानाध्यापक महोदय

  විදුහල්පතිතුමියට - आदरणीय प्रधानाध्यापक महोदया

  ගුරුවරුන්ට - पूज्य गुरुजण

  සහෝදර ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට - प्रिय भाइयो–बहनो

- පිළිගැනීමේ කථාවක දී හා ස්තුති කථාවක දී විශේෂිත වූ භාෂා යෙදුම් යෙදෙන බව
- දෙන ලද මාතෘකාව අනුව කථා කිරීමේ දී මාතෘකාව හැඳින්වීම, විස්තර කිරීම සහ අවසන් කිරීම යන අංග තුනක් ඇතුළත් වන බව

**යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය**

- පිළිගැනීමේ කථාවක්, ස්තුති කථාවක් සහ දෙන ලද මාතෘකාවකට අනුව කරන කථාවක් සඳහා යෝග්‍ය ආදර්ශන සිසුන්ට ලබා දෙන්න.
- එක් එක් කථාවල දී යෙදෙන විශේෂ භාෂා යෙදුම් පිළිබඳ ව සිසුන් සමඟ සාකච්ඡා කරන්න.
- කේවල වශයෙන් යෝග්‍ය ක්‍රියාකාරකම්වල යොදවන්න.

**ගුණාත්මක යෙදවුම්**

- ශ්‍රව්‍ය දෘශ්‍ය ඉගෙනුම් ආධාරක
- පිළිගැනීමේ කථා, ස්තුති කථා, විවිධ මාතෘකානුකූල කතා ඇතුළත් ඡායා පිටපත්

**තක්සේරුව හා ඇගයීම සඳහා නිර්ණායක**

- අවස්ථෝචිත ව නිවැරදි ව භාෂාව භාවිත කරමින් කතා කිරීමේ අවශ්‍යතාව පැහැදිලි කරයි.
- භාෂාත්මක යෙදුම් නිවැරදි ව භාවිත කරමින් කතා කිරීමේ හැකියාව අගය කරයි.
- උචිත අංග චලන භාවිත කරයි.
- කාලය පිළිබඳ සැලැකිලිමත් වෙමින් මාතෘකාව අනුව කතා කරයි.
- හඬ පාලනයෙන් සහ උචිත අංග චලන භාවිත කරමින් කතා කරයි.

**නිපුණතාව** 6.0 සම්මත ව්‍යාකරණ සහ භාෂා ප්‍රයෝග නිවැරදි ව භාවිත කරයි.

**නිපුණතා මට්ටම** 6.1 අව්‍ය පිළිබඳ අවබෝධය ලබයි.

**කාලච්ඡේද** **20**

**ඉගෙනුම් පල**

- සම්බන්ධසූචක අව්‍ය පද නිවැරදි ව භාවිත කරයි.
- සමුච්චයබෝධක අව්‍ය පද නිවැරදි ව භාවිත කරයි.
- විස්මයාදිබෝධක අව්‍ය පද නිවැරදි ව භාවිත කරයි.

**විෂය කරුණුවල සංක්ෂිප්තය**

- සම්බන්ධසූචක සහ සමුච්චයබෝධක අව්‍ය පද නාම පද, ක්‍රියා පද සහ වාක්‍ය අතර සම්බන්ධය ගොඩ නැඟීම සඳහා යොදා ගත හැකි බව
- සම්බන්ධසූචක අව්‍ය පද ක්‍රියා පද සමඟ එක් වීමේ දී ක්‍රියානාමය සමඟ යෙදෙන බව
- සම්බන්ධසූචක අව්‍ය පද के සහ की විභක්ති ප්‍රත්‍ය සමඟ යෙදෙන බව
- සම්බන්ධසූචක අව්‍ය පද සර්වනාම සමඟ යෙදෙන විට සර්වනාමයේ රූපය වෙනස් වන බව
- मैं, हम, तू, तुम යන සර්වනාම සමග සම්බන්ධ සූචක අව්‍ය පද යෙදෙන විට එම සර්වනාම मेरे, मेरी, हमारे, हमारी, तेरे, तेरी, तुम्हारे, तुम्हारी ලෙස පරිවර්තනය වී යෙදෙන බව
- සමුච්චයබෝධක අව්‍ය පද නාම පද සහ ක්‍රියා පද සමඟ යෙදෙන විට නාමපදවල සහ ක්‍රියා පදවල රූපය වෙනස් නොවන බව
- හැඟීම් ප්‍රකාශ කිරීම සඳහා විස්මයාදිබෝධක අව්‍ය පද යෙදෙන බව

**යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය**

- සම්බන්ධසූචක, සමුච්චය බෝධක සහ විස්මයාදිබෝධක අව්‍ය පද හඳුන්වා දෙන්න.
- නාම පද, ක්‍රියා පද සහ වාක්‍යවල මෙම අව්‍ය පද යෙදෙන ආකාරය පැහැදිලි කර දෙන්න.
- සම්බන්ධසූචක අව්‍ය පද යෙදෙන විට සර්ව නාමවල සිදු වන රූපීය වෙනස්කම් පැහැදිලි කර දෙන්න.
- සමුච්චයබෝධක අව්‍ය පද වාක්‍යවල යෙදෙන ආකාරය පැහැදිලි කර දෙන්න.
- විස්මයාදිබෝධක අව්‍ය පද වාක්‍යවල යෙදෙන ආකාරය පැහැදිලි කර දෙන්න.
- දැනුම තහවුරු කිරීම සඳහා යෝග්‍ය අභ්‍යාස ලබා දෙන්න.

**ගුණාත්මක යෙදවුම්**

- අව්‍ය පද දැක්වෙන ලැයිස්තු

**තක්සේරුව හා ඇගයීම් සඳහා නිර්ණායක**

- සුදුසු අව්‍ය පදය තෝරා ගැනීමේ හැකියාව ප්‍රදර්ශනය කරයි.
- නිවැරදි අව්‍ය පද යෙදීමේ හැකියාව අගය කරයි.
- චිත්‍ර සටහන් විස්තර කිරීමේ දී අව්‍ය පද නිවැරදි ව භාවිතා කරයි.
- අව්‍ය පද නිවැරදි ව භාවිත කරමින් ලේඛනයේ යෙදෙයි.

**නිපුණතාව** 6.0 සම්මත ව්‍යාකරණ සහ භාෂා ප්‍රයෝග නිවැරදි ව භාවිත කරයි.

**නිපුණතා මට්ටම** 6.2 කෘදන්ත පිළිබඳ අවබෝධය ලබයි.

**කාලච්ඡේද** 15

**ඉගෙනුම් පල**

- පූර්වකාලික් කෘදන්ත පද යොදා වාක්‍ය ලියයි.
- වර්තමාන්කාලික් කෘදන්ත පද යොදා වාක්‍ය ලියයි.
- භූත්කාලික් කෘදන්ත පද යොදා වාක්‍ය ලියයි.
- තාත්කාලික් කෘදන්ත පද යොදා වාක්‍ය ලියයි.
- කර්තෘවාචක් කෘදන්ත පද යොදා වාක්‍ය ලියයි.
- අපූර්ණ ක්‍රියාද්යෝතක් කෘදන්ත පද යොදා වාක්‍ය ලියයි.

**විෂය කරුණුවල සංක්ෂිප්තය**

- ක්‍රියා මූලයට कर හෝ के ප්‍රත්‍ය එක් කර පූර්වකාලික් කෘදන්ත පද සාදා ගත හැකි බව
- වර්තමාන කාල ක්‍රියා පදයට हुआ, हुए, हुई යන පද සාධන ප්‍රත්‍යවලින් එකක් එකතු කිරීමෙන් වර්තමානකාලික් කෘදන්ත පද සාදා ගත හැකි බව
- අතීත කාල ක්‍රියාපදයට हुआ, हुए, हुई යන පද සාධන ප්‍රත්‍යවලින් එකක් එකතු කිරීමෙන් භූත්කාලික් කෘදන්ත පද සාදා ගත හැකි බව
- වර්තමාන කාල පුරුෂලිංග බහුවචන ක්‍රියා පදයට ही නැමැති පද සාධන ප්‍රත්‍යය යොදා ගනිමින් තාත්කාලික් කෘදන්ත පද සාදා ගත හැකි බව
- සියලු ක්‍රියා නාමවල ने රූපයට वाला, वाले, वाली නමැති පද සාධන ප්‍රත්‍යය එකතු කිරීමෙන් කර්තෘවාචක් කෘදන්ත සාදා ගත හැකි බව
- වර්තාමාන කාල පුරුෂ ලිංග බහුවචන ක්‍රියා රූපයට हुए නමැති පද සාධන ප්‍රත්‍යය එකතු කිරීමෙන් අපූර්ණ ක්‍රියාද්යෝතක් කෘදන්ත පද සාදා ගත හැකි බව
- මෙම කෘදන්ත ප්‍රභේද අතරින් වර්තමාන්කාලික්, භූත්කාලික් හා කර්තෘවාචක් කෘදන්ත විකාරී කෘදන්ත වන අතර පූර්වකාලික්, තාත්කාලික් සහ අපූර්ණ ක්‍රියාද්යෝතක් යන කෘදන්ත අවිකාරී කෘදන්ත වන බව

**යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය**

- යෝග්‍ය ක්‍රියාකාරකම් ඇසුරෙන් කෘදන්ත පද සාදා ගන්නා ආකාරය සිසුන්ට පැහැදිලි කර දෙන්න.
- මෙම කෘදන්ත පද වාක්‍යවල යෙදෙන ආකාරය පැහැදිලි කර දෙන්න.
- කෘදන්ත පද යොදා වාක්‍ය නිර්මාණය කරවන්න.
- දැනුම තහවුරු කරවීමට සුදුසු අභ්‍යාස ලබා දෙන්න.

**ගුණාත්මක යෙදවුම්**

- කෘදන්ත දැක්වෙන වගු

**තක්සේරුව හා ඇගයීම් සඳහා නිර්ණායක**

- නිවැරදි ව කෘදන්ත භාවිත කිරීමේ හැකියාව ප්‍රදර්ශනය කරයි.
- කෘදන්ත පද නිවැරදි ව සකස් කරගැනීමේ හැකියාව අගය කරයි.
- නිවැරදි ක්‍රම අනුගමනය කරමින් කෘදන්ත පද සකස් කරයි.
- කෘදන්ත පද යොදා වාක්‍ය නිර්මාණය කරයි.

**නිපුණතාව** 7.0 කියවා ප්‍රතිචාර දක්වයි.

**නිපුණතා මට්ටම** 7.1 චිත්‍ර සටහන් විස්තර කරයි.

**කාලච්ඡේද** 10

**ඉගෙනුම් පල**

- චිත්‍ර සටහන්වල දැක්වෙන රූප හා ක්‍රියා විස්තර කරයි.
- ව්‍යාකරණ රීතිවලට අනුව වාක්‍ය ගොඩ නගයි.
- වාක්‍ය නිවැරදි ව උච්චාරණය කරයි.

**විෂය කරුණුවල සංක්ෂිප්තය**

- පින්තූරයෙහි දැක්වෙන චිත්‍ර සටහන්වලට අදාළ හින්දී නාම පද සහ ක්‍රියා පද හඳුනා ගත යුතු බව
- ව්‍යාකරණ රීතිවලට අනුව වාක්‍ය ගොඩ නැඟිය යුතු බව
- උච්චාරණ රීතිවලට අනුව වාක්‍ය නිවැරදි ව කියවිය යුතු බව

**යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය**

- සරල ක්‍රියාකාරකම් දැක්වෙන චිත්‍ර සටහන් කිහිපයක් සිසුන්ට ලබා දෙන්න.
- සිසුන් සමඟ සාකච්ඡා කරමින් චිත්‍ර සටහන්වලට අදාළ හින්දී නාම පද සහ ක්‍රියා පද පැහැදිලි කර දෙන්න.
- චිත්‍ර සටහන්වලට අදාළ ව වාක්‍ය ගොඩ නැගීමට උපදෙස් දෙන්න.
- වාක්‍ය කියවීමේ දී උච්චාරණ විශේෂතා සැලකිල්ලට ගත යුතු බව පහදා දෙන්න.

**ගුණාත්මක යෙදවුම්**

- විවිධ ක්‍රියාකාරකම් දැක්වෙන චිත්‍ර සටහන්

**තක්සේරුව හා ඇගයීම් සඳහා නිර්ණායක**

- චිත්‍ර සටහනේ දැක්වෙන රූප නම් කරයි.
- චිත්‍ර සටහනේ දැක්වෙන ක්‍රියා නම් කිරීමේ හැකියාව අගය කරයි.
- චිත්‍ර සටහනට අදාළ වාක්‍ය ගොඩ නගයි.
- උච්චාරණ විශේෂතා සැලැකිල්ලට ගෙන කියවයි.

**නිපුණතාව** 7.0 කියවා ප්‍රතිචාර දක්වයි.

**නිපුණතා මට්ටම** 7.2 සරල ඡේද හා පද්‍ය පාඨ කියවා විස්තර කරයි.

**කාලච්ඡේද** 20

**ඉගෙනුම් පල**

- ගද්‍ය සහ පද්‍ය පාඨ නිශ්ශබ්ද ව කියවයි.
- දුරවබෝධ පදවල අර්ථය විමසයි.
- අවබෝධයෙන් පිළිතුරු සපයයි.
- ගද්‍ය, පද්‍ය කොටස්වල අර්ථය සරල හින්දියෙන් ප්‍රකාශ කරයි.

**විෂය කරුණුවල සංක්ෂිප්තය**

- ගද්‍ය සහ පද්‍ය පාඨ අවබෝධය සඳහා අවධානයෙන් කියවිය යුතු බව
- ගද්‍ය පද්‍ය කොටස්වල අර්ථය නිවැරදි ව වටහා ගැනීම සඳහා දුරවබෝධ පදවල අර්ථය අසා දැන ගත යුතු බව
- නිවැරදි පිළිතුරු සැපයීම සඳහා අසා ඇති ප්‍රශ්න නිවැරදි ව අවබෝධ කර ගත යුතු බව
- ගද්‍ය සහ පද්‍ය කොටස් කියවා අවබෝධ කර ගෙන සරල හින්දියෙන් ප්‍රකාශ කළ යුතු බව

**යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය**

- නිර්දිෂ්ට හා පරිශීලන ග්‍රන්ථවල ගද්‍ය, පද්‍ය කොටස් සිසුන්ට ලබා දෙන්න.
- එම කොටස් නිශ්ශබ්ද ව අවධානයෙන් කියවීමට උපදෙස් දෙන්න.
- දුරවබෝධ පදවල අර්ථය පැහැදිලි කර දෙන්න.
- සිසුන් සමඟ සාකච්ඡා කරමින් තව දුරටත් එම කොටස් පැහැදිලි කර දෙන්න.
- ප්‍රශ්නාවලිය සිසුන්ට ලබා දෙන්න.
- පිළිතුරු ලිවීමට අවශ්‍ය කාලය ලබා දෙන්න.
- ලියා ඇති පිළිතුරු පරීක්ෂා කර, සිසුන් සමඟ සාකච්ඡා කරමින් වැරදි නිවැරදි කරවන්න.

**ගුණාත්මක යෙදවුම්**

- නිර්දිෂ්ට හා පරිශීලන ග්‍රන්ථ

**තක්සේරුව හා ඇගයීම් සඳහා නිර්ණායක**

- ගද්‍ය පද්‍ය පාඨ නිවැරදි ව කියවයි.
- අර්ථාවබෝධයෙන් යුතු ව කියවීමේ හැකියාව අගය කරයි.
- ගද්‍ය හා පද්‍ය පාඨ අර්ථාවබෝධයෙන් කියවයි.

**නිපුණතාව** 8.0 පරිවර්තනය කරයි.

**නිපුණතා මට්ටම** 8.1 හින්දී ගද්‍ය පාඨ සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාවට පරිවර්තනය කරයි.

**කාලච්ඡේද** 15

**ඉගෙනුම් පල**

- දී ඇති ගද්‍ය පාඨය අවධානයෙන් කියවයි.
- දුරවබෝධ පදවල අර්ථය සොයා දැන ගනියි.
- ගද්‍ය පාඨයෙහි අර්ථය අවබෝධ කරගෙන පරිවර්තනය කරයි.
- පරිවර්තිත (ලක්ෂ්‍ය) භාෂාවේ ව්‍යාකරණ රීතිවලට අනුකූල ව පරිවර්තනය කරයි.

**විෂය කරුණුවල සංක්ෂිප්තය**

- දී ඇති ගද්‍ය පාඨ අවධානයෙන් කියවිය යුතු බව
- දුරවබෝධ පදවල අර්ථය සොයා දැනගත යුතු බව
- ගද්‍ය පාඨයෙහි අර්ථය අවබෝධ කරගෙන පරිවර්තනය කළ යුතු බව
- පරිවර්තිත (ලක්ෂ්‍ය) භාෂාවේ ව්‍යාකරණ රීතිවලට අනුකූල ව පරිවර්තනය කළ යුතු බව

**යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය**

- පරිවර්තනය සඳහා යෝග්‍ය ගද්‍ය පාඨ සිසුන්ට ලබා දෙන්න.
- එම ගද්‍ය පාඨ අවධානයෙන් කියවීමට උපදෙස් දෙන්න.
- දුරවබෝධ පද, යෙදුම් සහ ව්‍යාකරණ රටා පැහැදිලි කර දෙන්න.
- අවබෝධයෙන් කියවා පරිවර්තනය කිරීමට අවස්ථාව ලබා දෙන්න.

**ගුණාත්මක යෙදවුම්**

- නිර්දිෂ්ට ග්‍රන්ථය
- යෝග්‍ය ගද්‍ය පාඨ ඇතුළත් ඡායා පිටපත්

**තක්සේරුව හා ඇගයීම් සඳහා නිර්ණායක**

- අර්ථය අවබෝධ කර ගෙන නිවැරදි ව පරිවර්තනය කරයි.
- අර්ථය විකෘති නොවන සේ පරිවර්තනය කිරීම අගය කරයි.
- පරිවර්තිත (ලක්ෂ්‍ය) භාෂා ශෛලිය අනුගමනය කරයි.
- විවිධ හින්දී ලේඛන පරිවර්තනය කරයි.

**නිපුණතාව** 8.0 පරිවර්තනය කරයි.

**නිපුණතා මට්ටම** 8.2 සිංහල/දෙමළ/ඉංග්‍රීසි ගද්‍ය පාඨ හින්දී භාෂාවට පරිවර්තනය කරයි.

**කාලච්ඡේද** 15

**ඉගෙනුම් පල**

- දී ඇති ගද්‍ය පාඨය අවධානයෙන් කියවයි.
- දුරවබෝධ පදවල අර්ථය සොයා දැන ගනියි.
- ගද්‍ය පාඨයෙහි අර්ථය අවබෝධ කරගෙන පරිවර්තනය කරයි.
- හින්දී භාෂාවේ ව්‍යාකරණ රීතිවලට අනුව පරිවර්තනය කරයි.

**විෂය කරුණුවල සංක්ෂිප්තය**

- දී ඇති ගද්‍ය පාඨ අවධානයෙන් කියවිය යුතු බව
- දුරවබෝධ පදවල අර්ථය සොයා දැනගත යුතු බව
- ගද්‍ය පාඨයෙහි අර්ථය අවබෝධ කරගෙන පරිවර්තනය කළ යුතු බව
- හින්දී භාෂාවේ ව්‍යාකරණ රීතීවලට අනුකූල ව පරිවර්තනය කළ යුතු බව

**යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය**

- පරිවර්තනය සඳහා යෝග්‍ය සිංහල/දෙමළ/ඉංග්‍රීසි සරල ගද්‍ය පාඨ සිසුන්ට ලබා දෙන්න.
- එම ගද්‍ය පාඨ අවධානයෙන් කියවීමට උපදෙස් දෙන්න.
- අවශ්‍ය වාක්කෝෂ ඥානය ලබා දෙන්න.
- අවබෝධයෙන් කියවා පරිවර්තනය කිරීමට අවස්ථාව ලබා දෙන්න.

**ගුණාත්මක යෙදවුම්**

- යෝග්‍ය සිංහල/දෙමළ/ඉංග්‍රීසි සරල ගද්‍ය පාඨ

**තක්සේරුව හා ඇගයීම් සඳහා නිර්ණායක**

- අර්ථය අවබෝධ කරගෙන නිවැරදි ව පරිවර්තනය කරයි.
- අර්ථය විකෘති නොවන පරිදි පරිවර්තනය කිරීම අගය කරයි.
- පරිවර්තිත භාෂාවේ භාෂා ශෛලිය අනුගමනය කරමින් පරිවර්තනය කරයි.

**•නිපුණතාව** 9.0 හින්දී සාහිත්‍යාංග රස විඳිමින් අන්තර්ගත හරධර්ම චරිතායනය කරයි.

**නිපුණතා මට්ටම** 9.1 හින්දී සාහිත්‍යාංග රස විඳියි.

**කාලච්ඡේද** 20

**ඉගෙනුම් පල**

- නිර්දිෂ්ට ග්‍රන්ථයේ හින්දී ගද්‍ය/පද්‍ය කියවයි.
- දුරවබෝධ පද, යෙදුම්, ව්‍යාකරණ රටා අවබෝධ කර ගෙන ගද්‍ය/පද්‍යවල අර්ථය ප්‍රකාශ කරයි.
- දෙනු ලබන ප්‍රශ්නවලට පිළිතුරු සපයයි.
- අවස්ථා සම්බන්ධය දක්වයි.
- පද්‍යවල අර්ථය සරල හින්දියෙන් ලියයි.

**විෂය කරුණුවල සංක්ෂිප්තය**

- ගද්‍ය/පද්‍ය අවධානයෙන් කියවිය යුතු බව
- නිවැරදි අර්ථාවබෝධය සඳහා දුරවබෝධ පද, යෙදුම්වල අර්ථය පැහැදිලි කර ගත යුතු බව
- සන්දර්භය දැක්වීමේ දී ගද්‍ය/පද්‍ය නිර්මාණවල රචකයා, පාඩම හා අවස්ථාව පිළිබඳ අවබෝධ කරගත යුතු බව

**යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය**

- ගද්‍ය/පද්‍ය කියවා එහි අර්ථය පිළිබඳ ව සිසුන් සමඟ සාකච්ඡා කරන්න.
- ප්‍රශ්නෝත්තර රටාව මඟින් පාඩම පැහැදිලි කර දෙන්න.
- ගද්‍ය/පද්‍යවල අවස්ථා සම්බන්ධය ලිවීම ප්‍රගුණ කරවන්න.
- පද්‍යවල අර්ථය සරල හින්දියෙන් ලිවීමට අවස්ථාව ලබා දෙන්න.

**ගුණාත්මක යෙදවුම්**

- නිර්දිෂ්ට ග්‍රන්ථය
- ශබ්ද කෝෂ
- අන්තර්ජාලය

**තක්සේරුව හා ඇගයීම් සඳහා නිර්ණායක**

- අර්ථාවබෝධයෙන් කියවා අදහස් ප්‍රකාශ කරයි.
- කියවන ලද පාඨයේ අවස්ථා/සිද්ධිවල අන්තර් සම්බන්ධතා දක්වයි.
- ලේඛනයේ දී රූඪී, ප්‍රස්තාව පිරුළු, ආප්තෝපදේශ උචිත පරිදි භාවිත කරයි.
- විවිධ වචනවල අර්ථ ප්‍රකාශනය වන සේ වාක්‍ය ලියයි.

**නිපුණතාව** 9.0 හින්දී සාහිත්‍යාංග රස විඳිමින් අන්තර්ගත හරධර්ම චරිතායනය කරයි.

**නිපුණතා මට්ටම** 9.2 භාරතයේ ශ්‍රේෂ්ඨ පුද්ගල චරිත හඳුනා ගනියි.

**කාලච්ඡේද** 15

**ඉගෙනුම් පල**

- අදාළ පාඩම කියවා ප්‍රශ්නවලට පිළිතුරු දෙයි.
- භාරතයේ ශ්‍රේෂ්ඨ පුද්ගල චරිත හඳුනාගෙන කෙටි සටහන් ලියයි.
- ශ්‍රේෂ්ඨ පුද්ගලයන්ගේ විශේෂ චරිත ලක්ෂණ පිළිබඳ සාකච්ඡා කරයි.

**විෂය කරුණුවල සංක්ෂිප්තය**

- අදාළ පාඩම කියවා භාරතයේ ශ්‍රේෂ්ඨ පුද්ගල චරිත හඳුනා ගත යුතු බව
- එම චරිත ඇසුරෙන් තම ජීවිතයට ආදර්ශ ලබා ගත හැකි බව

**යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය**

- පාඩම කියවා පැහැදිලි කර දෙන්න.
- එම ශ්‍රේෂ්ඨ පුද්ගලයන්ගේ විශේෂ චරිත ලක්ෂණ පිළිබඳ ව සාකච්ඡා කරන්න.
- ශ්‍රේෂ්ඨ පුද්ගලයන්ගේ චරිත පිළිබඳ කෙටි සටහන් ලිවීමට උපදෙස් දෙන්න.

**ගුණාත්මක යෙදවුම්**

- නිර්දිෂ්ට ග්‍රන්ථය

**තක්සේරුව හා ඇගයීම් සඳහා නිර්ණායක**

- ශ්‍රේෂ්ඨ පුද්ගලයන්ගේ චරිත තොරතුරු හඳුනා ගෙන ඉදිරිපත් කරයි.
- ශ්‍රේෂ්ඨ පුද්ගලයන්ගේ චරිත ලක්ෂණ අගය කරයි.
- ශ්‍රේෂ්ඨ පුද්ගල චරිත ලක්ෂණ චරිතායනය කරයි.
- ශ්‍රේෂ්ඨ චරිත හඳුනා ගැනීම සඳහා විවිධ නිර්මාණ ඇසුරු කරයි.

**නිපුණතාව** 9.0 හින්දී සාහිත්‍යාංග රස විඳිමින් අන්තර්ගත හරධර්ම චරිතායනය කරයි.

**නිපුණතා මට්ටම** 9.3 හින්දී සාහිත්‍යාංග ඇසුරින් උත්තර භාරතීය සංස්කෘතිය හඳුනා ගනියි.

**කාලච්ඡේද** **20**

**ඉගෙනුම් පල**

- උත්තර භාරතීය ආහාර පාන නම් කරයි.
- උත්තර භාරතීය ඇඳුම් පැලඳුම් නම් කරයි.
- උත්තර භාරතීය උත්සව නම් කරයි.
- උත්තර භාරතීය ක්‍රීඩා (කෙළි - සෙල්ලම්) නම් කරයි.
- උත්තර භාරතීය ජන කථා විස්තර කරයි.
- උත්තර භාරතීය ජන සමාජය පිළිබඳ ව තොරතුරු පවසයි.

**විෂය කරුණුවල සංක්ෂිප්තය**

- උත්තර භාරතයට විශේෂිත වූ ආහාර පාන ඇති බව (रोटी, पूड़ी, लड्डू, समोसा, गुलाब-जामुन, जलेबी, हल्वा)
- උත්තර භාරතයට විශේෂිත වූ ඇඳුම් - පැලඳුම් ඇති බව (कुर्ता, पायजामा, साड़ी)
- උත්තර භාරතයට විශේෂිත වූ උත්සව ඇති බව (होली, दशहरा, रक्षाबंधन, दीपावली)
- උත්තර භාරතයට විශේෂිත වූ ක්‍රීඩා (කෙළි සෙල්ලම්) ඇති බව (कबड्डी, गुल्ली डंडा, आँखमिचौनी, खो-खो)

**යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය**

- උත්තර භාරතීය සංස්කෘතිය පිළිබඳ ව සිසුන් සමඟ සාකච්ඡා කරන්න.
- නිර්දිෂ්ට ග්‍රන්ථය ඇසුරෙන් උත්තර භාරතීය සංස්කෘතියේ විවිධ අංග (ආහාර පාන, ඇඳුම් පැලඳුම්, උත්සව, ක්‍රීඩා) පිළිබඳ හැඳින්වීමක් කරන්න.
- උත්තර භාරතයේ විවිධ සංස්කෘතික අංග දැක්වෙන ක්ෂේත්‍ර පොත් නිර්මාණයට යොමු කරවන්න.
- උත්තර භාරතයේ විවිධ සංස්කෘතිකාංග පිළිබඳ ශබ්දාවලියක් (වාක්කෝෂයක්) ලබා දෙන්න.

**ගුණාත්මක යෙදවුම්**

- නිර්දිෂ්ට ග්‍රන්ථය
- වීඩියෝ පට
- ඡායාරූප
- අන්තර්ජාලය

**තක්සේරුව හා ඇගයීම් සඳහා නිර්ණායක**

- උත්තර භාරතීය ආහාර පාන, ඇඳුම් පැලඳුම්, උත්සව, කෙළි සෙල්ලම් පිළිබඳ තොරතුරු ප්‍රකාශ කරයි.
- උත්තර භාරතීය සංස්කෘතිය අගය කරමින් කථා කරයි.
- උත්තර භාරතීය සංස්කෘතිකාංග ඇතුළත් නිර්මාණ පරිශීලනය කරයි.
- උත්තර භාරතීය සංස්කෘතිකාංග අවස්ථෝචිත ව ඉදිරිපත් කරයි.

**නිපුණතාව** 10.0 නූතන හින්දී සාහිත්‍ය ඉතිහාසය පිළිබඳ මූලික අවබෝධය ලබයි.

**නිපුණතා මට්ටම** 10.1 නූතන හින්දී සාහිත්‍යයේ එන සාහිත්‍යකරුවන් හඳුනාගනියි.
10.2 නූතන හින්දී සාහිත්‍යයේ එන සාහිත්‍යකරුවන්ගේ නිර්මාණ හඳුනා ගනියි.

**කාලච්ඡේද** 30

**ඉගෙනුම් පල**

- හින්දී සාහිත්‍ය ඉතිහාසයේ 'නූතන යුගයේ' (ආධුනික් කාල්) යුග නම් කරයි.
- ඒ ඒ යුගවල සාහිත්‍යධරයන් නම් කරයි.
- ඒ ඒ යුගවල සාහිත්‍යධරයන්ගේ පෞද්ගලික සහ නිර්මාණ ජීවිතය පිළිබඳ විස්තර කරයි.

**විෂය කරුණුවල සංක්ෂිප්තය**

- හින්දී සාහිත්‍ය ඉතිහාසයේ 'නූතන යුගය', (ආධුනික් කාල්) අවදි හතරකට බෙදෙන බව
- ඒ එක් එක් අවදියෙහි පසුබිම වෙනස් වන බව
- ඒ එක් එක් අවදියෙහි සාහිත්‍යයෙහි සුවිශේෂ ලක්ෂණ ඇති බව

**යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය**

- නූතන යුගයේ අවදි පිළිබඳ ව සිසුන් සමඟ සාකච්ඡා කරන්න.
- ඒ එක් එක් අවදියෙහි ප්‍රමුඛ සාහිත්‍යකරුවන් හඳුන්වා දෙන්න.
- එම සාහිත්‍යකරුවන්ගේ පෞද්ගලික ජීවන තොරතුරු සහ නිර්මාණ ජීවිතය පිළිබඳ ව විස්තර කරන්න.
- ඒ එක් එක් අවදියෙහි සාහිත්‍යයේ විශේෂතා හඳුන්වා දෙන්න.

**ගුණාත්මක යෙදවුම්**

- නූතන හින්දී සාහිත්‍ය ඉතිහාසය (සංශෝධිත සංස්කරණය)

**තක්සේරුව හා ඇගයීම් සඳහා නිර්ණායක**

- නූතන සාහිත්‍ය යුග නම් කරයි.
- ඒ ඒ යුගවල සාහිත්‍යධරයන්ගේ තොරතුරු හඳුනාගෙන අගය කරයි.
- නූතන සාහිත්‍ය යුගවලට අයත් නිර්මාණ කියවයි.
- නිර්මාණ කරුවන්ගේ සාහිත්‍ය සේවය විස්තර කරයි.

## ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය ප්‍රවර්ධනය කිරීමේ නිදර්ශක ආධාරකය

1. පාසල් වාරය : පළමු වන වාරය

2. ආධාරක අංකය : 01

3. ආවරණය කෙරෙන නිපුණතා මට්ටම : 3.1

4. ආවරණය කෙරෙන විෂය සන්ධාරය :
   - දෙන ලද මාතෘකාවක් යටතේ රචනාවක් ලිවීම.
   - ව්‍යාකරණ රීතින්ට අනුගත ව ලිවීම.
   - අදහස් නිරවුල් ව සංවිධානාත්මක ව ඉදිරිපත් කිරීම.
   - ප්‍රමාණාත්මක ව කරුණු ඉදිරිපත් කිරීම.
   - නිවැරදි ආකෘතියට අනුව රචනාව ලිවීම

5. ආධාරකයේ ස්වභාවය :
   - ලිඛිත පරීක්ෂණයක්

6. ආධාරකයේ අරමුණු
   - මාතෘකාවට අදාළ ව කරුණු පෙළගස්වමින් රචනාව ලිවීමට හුරු කිරීම.
   - ව්‍යාකරණ රීතින්ට අනුව වාක්‍ය නිවැරදි ව ලිවීමට හුරු කිරීම.
   - නිවැරදි ආකෘතියට අනුව රචනා ලිවීමට හුරු කිරීම.
   - රචනාවට අදාළ ව අදහස් නිරවුල් ව සංවිධානාත්මක ව හා ප්‍රමාණාත්මක ව ඉදිරිපත් කිරීමට හුරු කිරීම.

7. ආධාරකය ක්‍රියාත්මක කිරීමට උපදෙස් :

*ගුරු භවතුන් සඳහා උපදෙස්*

- යෝග්‍ය ආදර්ශනයක් භාවිතයෙන් සිසුන්ට රචනාවක ආකෘතිය හඳුන්වා දෙන්න.
- රචනාවක් ලිවීම සඳහා සරල මාතෘකාවක් සිසුන්ට ලබා දෙන්න.
- එම රචනාවට අදාළ ව සහායක ශබ්දාවලියක් ලබා දෙන්න.
- ඒ ඇසුරින් රචනාවට අදාළ ව කරුණු පෙළගස්වමින් ව්‍යාකරණ රීතින්ට අනුගත ව වාක්‍ය නිවැරදි ව ලිවීම තහවුරු වන පරිදි සිසුන් කේවලව අභ්‍යාසවල නිරත කරවන්න.

***සිසුන් සඳහා උපදෙස්***

- දී ඇති උපදෙස් මැනවින් අනුගමනය කරමින් අභ්‍යාසයෙහි නිරත වන්න.

8. ඇගයීම් ක්‍රමය:

| සිසුන්ගේ නම් / නිර්ණායක | නිවැරදි ආකෘතියට අනුව ලියයි. | අදහස් නිරවුල් ව සංවිධානාත්මක ව ඉදිරිපත් කරයි. | ප්‍රමාණාත්මක ව කරුණු ඉදිරිපත් කරයි. | ව්‍යාකරණ රීතීන්ට අනුව වාක්‍ය නිවැරදිව ලියයි. | කාල කළමනාකරණය | එකතුව |
|---|---|---|---|---|---|---|
| | | | | | | |

**ලකුණු පරාසය**

ඉතා හොඳයි - 04

හොඳයි - 03

මධ්‍යස්ථයි - 02

සංවර්ධනය විය යුතුයි - 01